# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2006 - 2017 පෙබරවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2017.02.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

### තනතුරු - ඇබෑර්තු

**අධිකරණ සේවා කොමිෂන් සභාව**

පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවාගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සඳහන් සුදුසුකම් ඇති පුද්ගලයින්ට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල් - ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතුය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචිවී සිටීම නීතිමය වශයෙන් අවශ්‍යය.

කාතිවරයාට මසකට රුපියල් 7,500 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2017 මාර්තු මස 17 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල් පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,<br>
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,<br>
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 ජනවාරි මස 18 වැනි දින,<br>
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,<br>
තැ. පෙ. 573,<br>
කොළඹ 12.

**උපලේඛනය**

1. ගම්පොල (උඩපළාත) - මහනුවර දිස්ත්‍රික්කයේ ගම්පොල (උඩපළාත) අධිකරණ කලාපයේ කාති තනතුරට මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

***1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ක්වාසිවරයෙකු පත් කිරීමේ ඉල්ලුම් පත්‍රය***

ක්වාසි බල ප්‍රදේශය :

1. මුලකුර සමග නම :

උදා. : අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උදා. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :
4. ලිපිනය :
5. උපන් දිනය :
6. වයස :
7. ජාතිය :
8. ආගම :
9. ජා. හැ. ප. අංකය :
10. .දුරකතන අංකය :
11. අධ්‍යාපන සුදුසුකම් :
    1. ........................................................................
    2. ........................................................................
    3. ........................................................................
    4. ........................................................................
    5. ........................................................................
12. වෘත්තීය සුදුසුකම් :
    1. ........................................................................
    2. ........................................................................
    3. ........................................................................
    4. ........................................................................
    5. ........................................................................
13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :
14. ඉස්ලාම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? : ඔව් / නැත
15. විවාහක ද ? : ඔව් / නැත
16. භාර්යාව ජීවත්ව සිටී ද? : ඔව් / නැත
17. ඉහත දී කරන ලද සහ දැනට කරන රැකියා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපල වටිනාකම : රු.
19. මාසික ආදායම : රු.
20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.
21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද : ඔව් / නැත
22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද : ඔව් / නැත
23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? : ඔව් / නැත
24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :
25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වගකිවයුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකථන අංක : | දුරකථන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

______________,<br>
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————————.<br>
*සටහන* :

සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

02-532

---

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා භාරගන්නා සියලුම දැන්වීම් ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 මාර්තු මස 03 වැනි දින පළ කෙරෙන ගැසට් පත්‍රයේ දැන්වීම් 2017 පෙබරවාරි මස 17 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ගංගානි ලියනගේ,**<br>
රජයේ මුද්‍රණාලයාධිපති (වැ.බ.)

2017 ජනවාරි මස 01 වැනි දින,<br>
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,<br>
කොළඹ 08.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

## ශ්‍රී ලංකා පොලීසිය

### උප පොලිස් පරීක්ෂක තනතුර - විශේෂ කාර්ය බලකාය

ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුරට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2017.03.10 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,93,480 - 7 x 4,440 - 2 x 5,940 - 25 x 7,920 - රු. 6,34,440.00

2016.01.01 වැනි දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | දිරි දීමනාව | රු. 1,500 0 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (ඈ) | මූලික වැටුපෙන් 1/4 දීමනාව | රු. 3,962 50 |
| (ඉ) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |

(ඊ) සංයුක්ත දීමනා රු. 12,000 0 (400 x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා)

(උ) සංයුක්ත දීමනා රු. 9,600 0 (400 x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා)

*මෙම දීමනා වලට අමතරව -*

(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැකිය.)
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනිකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 27 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

- අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 06කින් සමත්ව එම විෂයයන් 04ක් සඳහා සම්මාන සාමාර්ථ තිබිය යුතු අතර, ඉන් 02ක් මාධ්‍ය භාෂාව හා ගණිතය විය යුතු ය.
- අයදුම්කරු අ.පො.ස. (උ.පෙළ) විභාගයෙන් එකවර විෂයයන් 03ක් සමත්විය යුතුය.

**සටහන 01** : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

**සටහන 02** : අ.පො.ස (සා. පෙළ)1 විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

**සටහන 03** : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඈ) *ශාරීරික සුදුසුකම්* :
- උස අඩි 05 යි. අඟල් 06 යි. (අවම),
- පපුව අඟල් 32 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්.*— එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙක් සුදුසුකම්* :

* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

- අයදුම්පත්‍රය අනුව මූලික සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය *හෙවත්* ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය

| *ව්‍යායාමය* | *වාර ගණන* | *කාලය (මිනිත්තු)* |
|---|---|---|
| මීටර් 1,000 දිවීම | - | 04 |
| චිනප්ස් (Chin ups) | 06 | 01 |
| පුෂප්ස් (Push ups) | 20 | 01 |
| සිටප් (Sit ups) | 20 | 01 |
| ස්කොට්ට්‍රස් (Scott thrush) | 18 | 01 |

- ආත්ම විශ්වාසය පරීක්ෂා කිරීමේ පරීක්ෂණය (බාධක තරණ අභ්‍යාස)
- ආරම්භක ශක්තිය හා ප්‍රතිචාර දැක්වීමේ පරීක්ෂණය
- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.
- ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,
  - වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
  - සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයට බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය* :
(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.

- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :
- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.
(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.
(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.
(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු ය. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.
(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතුන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.
(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.
(උ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.
(ඌ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.
(එ) ආධුනික උප පොලිස් පරීක්ෂකවරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.
(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතු ය.) :-
(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතු ය.
(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරයකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.*— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2017 ජනවාරි මස 23 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා**

## ශ්‍රී ලංකා පොලීසිය

### ආධුනික උප පොලිස් පරීක්ෂක තනතුර - විශේෂ කාර්ය බලකාය

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමඟ) :————.
(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.
04. අයදුම්කරු උපන් ස්ථානය :————.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.
පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :
(අ) ————.
(ආ) ————.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවය කර තිබේ ද ? :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :————.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :————.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :————.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

————.

අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .......................... මයා/ මිය/මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

————,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

තනතුර :————.
දිනය :————.

02-460/1

---

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් තනතුර - විශේෂ කාර්ය බලකාය

ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2017.03.10 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

(අ) ජීවන වියදම් දීමනාව රු. 7,800 0
(ආ) දිරි දීමනාව රු. 1,500 0
(ඇ) නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා රු. 250 0
(ඈ) මූලික වැටුපෙන් 1/4 දීමනාව රු. 3570 0
(ඉ) දුෂ්කර දීමනාව රු. 2000 0
(ඊ) සංයුක්ත දීමනා රු. 10,500 0 (350 x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා)
(උ) සංයුක්ත දීමනා රු. 8,400 0 (350 x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා)

මෙම දීමනා වලට අමතරව -
(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරින්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනියුක්ත නිලධාරින්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය. එසේ වුවද දැනට ශ්‍රී ලංකා පොලිසියේ රාජකාරියේ නියුතු පොලිස් කොස්තාපල් රියදුරන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 27 දක්වා අයදුම්කළ හැක.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :
- අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයන් 05ක් සමත් විය යුතුය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

සටහන 01 : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

සටහන 02 : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

සටහන 03 : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :
- උස අඩි 05 යි. අඟල් 04 යි. (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්*.— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :
* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කරන පොලිස් නිලධාරින්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :-
- අයදුම්පත් අනුව මූලික සුදුසුකම් ලබන අයදුම්කරුවන් සඳහා ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය :

| ව්‍යායාමය | වාර ගණන | කාලය (මිනිත්තු) |
|---|---|---|
| මීටර් 1000 දිවීම | - | 04 |
| චිනප්ස් (Chin ups) | 05 | 01 |
| පුෂප්ස් (Push ups) | 15 | 01 |
| සිටප් (Situps) | 15 | 01 |
| ස්කොට්ට්‍රස් (Scott thrush) | 12 | 01 |

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.
- ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,
  - වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
  - සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය* :
(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.
(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරින් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :
- මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි* :
(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.
(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.
(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝග යන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.
(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලීසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු ය. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.
(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරින් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.
(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.
(උ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.
(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.
(එ) ආධුනික පොලිස් කොස්තාපල්වරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.
(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-
(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.
(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන*.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2017 ජනවාරි මස 23 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

## ශ්‍රී ලංකා පොලීසිය

### ආධුනික පොලිස් කොස්තාපල් තනතුර - විශේෂ කාර්ය බලකාය

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :————.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමග) :————.
(ඇ) අයදුම් කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)
03. පියාගේ සම්පූර්ණ නම :————.
04. අයදුම්කරු උපන් ස්ථානය :————.
උපන් ස්ථානයට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(ඊ) දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? *නැතහොත්* ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.
* අයදුම්කරු :————.
* අයදුම්කරුගේ පියා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.
පපුව : අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :————.
10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)
11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.

14. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :
(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිසියේ සේවය කර තිබේ ද ? :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇත්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලිසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................... මයා/ මිය/මෙනෙවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.
දිනය :———.

02-460/2

---

## ශ්‍රී ලංකා පොලිසිය

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුර - (විශේෂ කාර්ය බලකාය)

ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුරට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාසය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06, යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2017.03.10 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිටය.

තව ද මෙම නිලධාරින් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබාදී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | දිරි දීමනාව | රු. 1,500 0 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (ඈ) | මූලික වැටුපෙන් 1/4 දීමනාව | රු. 3,570 0 |
| (ඉ) | දුෂ්කර දීමනාව | රු. 2,000 0 |
| (ඊ) | සංයුක්ත දීමනා | රු. 10,500 0 (350 x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) |
| (උ) | සංයුක්ත දීමනා | රු. 8,400 0 (350 x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) |

මෙම දීමනාවලට අමතරව -
(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරින්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍යය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) විශේෂ කාර්ය බලකායේ මූලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනිකුත් නිලධාරීන්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18-25 ත් අතර විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :
අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයයන් 05ක් සමත් විය යුතුය. (විෂයයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

***සටහන* 01** : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

***සටහන* 02** : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

***සටහන* 03** : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :
- උස අඩි 05 යි. අඟල් 02 යි. (අවම)

***සටහන*** : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මදක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්*.— එක් ඇසක දෘෂ්ටිය 6/12ට අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කාරියක් උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) *අනෙකුත් සුදුසුකම්* :
* අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :
- අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කාරියන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

| *ව්‍යායාමය* | *වාර ගණන* | *කාලය (මිනිත්තු)* |
|---|---|---|
| මීටර් 1000 දිවීම | - | 06 |
| පුෂප්ස් (Push ups) | 15 | 01 |
| සිටප් (Situps) | 15 | 01 |
| ස්කොට්ට්‍රස් (Scott thrush) | 12 | 01 |

- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.
- ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,
  - වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතු ය.
  - සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය* :
අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කාරියන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය* :
(අ) අයදුම්කාරියන්ගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.
(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කළ බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි* :

- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

10. *සේවා කොන්දේසි* :
(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාලපරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරා ගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝග යන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.
(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිනියක්ම ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.
(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරිනියන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍ර ලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.
(ඊ) අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලීසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඇයගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.
(ඌ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.
(එ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලීසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන*.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2017 ජනවාරි මස 23 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)**

## ශ්‍රී ලංකා පොලීසිය

### ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර - විශේෂ කාර්ය බලකාය

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමග) :———.
(ඇ) අයදුම් කරන තනතුර :———.

02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අමුණා එවිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.
04. අයදුම්කාරිය උපන් ස්ථානය :———.
උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :———.
පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරි වසම සහ :———.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :———.
(ඊ) දුරකතන අංකය : (නිවස) :———.
ජංගම දුරකතන අංකය :———.

06. (අ) ජාතිය :———.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කාරිය :———.
* අයදුම්කාරියගේ පියා :———.
* අයදුම්කාරියගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කාරියගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)
අවුරුදු :———. මාස :———. දින :———.

08. උස : අඩි :———. අඟල් :———.
09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.
10. අතිරේක සුදුසුකම් :———. (සහතික පත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)
11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.
14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :
(අ) ———.
(ආ) ———.

15. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලීසියේ සේවය කර තිබේ ද ? :———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.
19. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධ චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී ශ්‍රී ලංකා පොලීසියේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

20. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ........................ මිය/මෙනවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.
දිනය :———.

02-460/3

---

## ශ්‍රී ලංකා පොලීසිය

### පොලිස් කොස්තාපල් රියදුරු තනතුර - විශේෂ කාර්ය බලකාය

ශ්‍රී ලංකා පොලිසියේ විශේෂ කාර්ය බලකායට සෘජුවම බඳවා ගැනීම සඳහා ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුරට ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ''අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කොට්ඨාස අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06'' යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහලින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2017.03.10 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයදුම්පත් ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර ශ්‍රී ලංකා පොලිසිය විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :
රු. 3,54,480 - 7 x 3,600 - 27 x 4,440 - රු. 4,99,560.00

2016.01.01 දින සිට ගෙවීම් කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3-2016 හි 11 වන උපලේඛනය අනුව වේ. මෙම වැටුප් පරිමාණයන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 වැනි දින සිටය.

තවද මෙම නිලධාරීන් 2013.01.07 වැනි දිනැති පොලිස්පති චක්‍රලේඛ අංක 2416/2013 යටතේ ලබා දී ඇති දීමනාවලට ද හිමිකම් ලබයි. ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ඇත.

| | | |
|---|---|---|
| (අ) | ජීවන වියදම් දීමනාව | රු. 7,800 0 |
| (ආ) | දිරි දීමනාව | රු. 1,500 0 |
| (ඇ) | නිල ඇඳුම් පිරිසිදු කිරීමේ දීමනා | රු. 250 0 |
| (ඈ) | මූලික වැටුපෙන් 1/4 දීමනාව | රු. 3570 0 |
| (ඉ) | දුෂ්කර දීමනාව | රු. 2000 0 |
| (ඊ) | සංයුක්ත දීමනා | රු. 10,500 0 (350 - x 30 විශේෂ දීමනා ගෙවනු ලබන ප්‍රදේශ සඳහා) |
| (උ) | සංයුක්ත දීමනා | රු. 8,400 0 (350 - x 24 විශේෂ දීමනා ගෙවනු නොලබන ප්‍රදේශ සඳහා) |

*මෙම දීමනා වලට අමතරව* -
(අ) නොමිලේ ගමන් පහසුකම්,
(ආ) නිලධාරින්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)
(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.
(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.
(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම් ද දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරි සඳහා තෑගි වශයෙන් මුදල් ද ප්‍රදානය කරනු ලැබේ.
(ඊ) විශේෂ කාර්ය බලකායේ මුලික පුහුණුවෙන් පසු විශේෂ කාර්ය බලකායේ සේවය කරන කාලය තුළ පමණක් විශේෂ කාර්ය බලකායේ අනිකුත් නිලධාරින්ට ගෙවනු ලබන විශේෂ දීමනාවලට හිමිකම් ඇත.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :
(අ) *වයස් සීමාව* :
*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 19-26 ත් අතර විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :
- අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේදී විෂයන් 05ක් සමත් විය යුතුය. (විෂයන් 05 ඇතුළත ගණිතය හෝ මාධ්‍ය භාෂාව යන විෂයන් දෙකම හෝ ඉන් එකක් හෝ සමත් විය යුතුය.)

**සටහන 01** : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.
**සටහන 02** : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.
**සටහන 03** : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

* පහත සඳහන් සුදුසුකම් සපුරනු ලබන අයදුම්කරුවන් සම්බන්ධයෙන් වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.
* රජයේ හෝ රජය පිළිගත් ආයතනයකින් පූර්ණ කාලීන වසර 3ක මෝටර් කාර්මික පාඨමාලාවක් හදරා තිබීම හා එම ක්ෂේත්‍රයේ වසර 3ක පළපුරුද්ද.

(ඇ) *ශාරීරික සුදුසුකම්* :
- උස අඩි 05 යි. අඟල් 03 යි. (අවම),
- පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා).

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞෂල්‍යයකින් යුක්තවූත් ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඈ) වෘත්තීය සුදුසුකම් :
(1) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම.
(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් අවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන* : මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අළුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද, රිය පැදවීමේ දිගුකාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.
* රිය පැදවීමේ දක්ෂතාව පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අපේක්ෂකයකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.
* මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන්ගේ වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුනත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමත් පරීක්ෂා කරනු ලැබේ.

(ඉ) *දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන්.*— එක් ඇසක දෘෂ්ඨිය 6/12ට අඩු නොවිය යුතු ය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේනම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ඨිය සාමාන්‍ය විය යුතු ය. යම් අයදුම්කරුවෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශකාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම්* :
* අයදුම්කරු අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා නුසුදුස්සන් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :
- අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත්විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
- ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය :
මීටර් 1000 - විනාඩි 04 යි.
- යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

06. වෘත්තීමය සුදුසුකම් :
6.1 වෘත්තීයමය පරීක්ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පොලිස් රියදුරු පාසලේ සහකාර අධ්‍යක්ෂ විසිනි.

6.2 වෘත්තීයමය පරීක්ෂණය සඳහා ලකුණු 100ක් වෙන් කර ඇත. මෙම වෘත්තීයමය පරීක්ෂණය පහත පරිදි සමන්විත වේ.

| | | |
|---|---|---|
| (අ) | රිය පැදවීමේ ප්‍රවීනතාවය | ලකුණු 50 |
| (ආ) | මාර්ග නීති උපදේශක සංග්‍රහය | ලකුණු 25 |
| (ඇ) | වාහන නඩත්තු කිරීම සහ සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනීම | ලකුණු 25 |

6.3 වෘත්තීයමය පරීක්ෂණය රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නීති උපදේශක සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුලු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක්ද ලබා ගෙන වෘත්තීයමය පරීක්ෂණය සඳහා වෙන් කර ඇති මුලු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබා ගෙන ඇති අයදුම්කරුවන් වෘත්තීයමය පරීක්ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීයමය පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් පමණක් වෛද්‍ය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

සටහන : බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් ආධුනික කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබා ගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

07. *වෛද්‍ය පරීක්ෂණය* :
අයදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණය බඳවා ගැනීම් ක්‍රියාවලියේ එක් අංගයක් පමණි. වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වූ අයදුම්කරුවන් අතරින් පවතින පුරප්පාඩු ප්‍රමාණය, ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලැබේ. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *පසුබිම් පරීක්ෂණය* :
(අ) අයදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ ද යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.
(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම හා තොරතුරු වසන් කිරීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව හා තොරතුරු වසන් කල බව බඳවා ගැනීමෙන් පසුව හෙළිවුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම* :
- රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරින් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබා ගත යුතු ය.
- 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව මගින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.
- පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි* :
- මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

11. *සේවා කොන්දේසි* :
(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.
(ආ) තෝරා ගනු ලබන අයදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.
(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝග යන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.
(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙක්ම ශ්‍රී ලංකා පොලිසිය විසින් පවත්වනු ලබන නියමිත පරීක්ෂණවලින් සමත් විය යුතුය. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.
(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරින් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් *පොලිස් ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.
(ඊ) අයදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් ශ්‍රී ලංකා පොලිසියේ සේවය කළ යුතු වන අතර මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.
(උ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.
(ඌ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ අංක 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.
(එ) ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් සේවය ස්ථිර කිරීමෙන් පසු ශ්‍රී ලංකා පොලිසියේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. (අ) මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.
(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයදුම්කරුවන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-
(අ) උප්පැන්න සහතිකය,
(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),
(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,
(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,
(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික, (තිබේ නම් පමණක්),
(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.
(උ) රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක්

14. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් අමුණා එවිය යුතුය.
(ආ) අයදුම්කරු විසින් අයදුම්පත අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කර අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන.—* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

පූජිත් ජයසුන්දර,
පොලිස්පති.

2017 ජනවාරි මස 23 වැනි දින,
පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**ශ්‍රී ලංකා පොලීසිය**
**ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර - විශේෂ කාර්ය බලකාය**
ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම :———.
(පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය.
(ආ) නම (මුලකුරු සමඟ) :———.
(ඇ) අයදුම් කරන තනතුර :———.
02. ජාතික හැඳුනුම්පත් අංකය :———.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)
03. පියාගේ සම්පූර්ණ නම :———.
04. අයදුම්කරු උපන් ස්ථානය :———.
උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :———.
පළාත :———.
05. (අ) වර්තමාන ලිපිනය :———.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඇ) ස්ථිර ලිපිනය :———.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ මැතිවරණ කොට්ඨාසය :———.
(ඊ) ස්ථිර ලිපිනයට අදළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :——.
(උ) දුරකථන අංකය : නිවස :———. ජංගම :———.

06. (අ) ජාතිය :———.
(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :———.
(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.
* අයදුම්කරු :———.
* අයදුම්කරුගේ පියා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය :———. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)
වයස : (*ගැසට්* නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කරන අවසන් දිනට)
අවුරුදු :———, මාස :———, දින :———.

08. උස : අඩි :———. අඟල් :———.
පපුව : අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය) :———.

10. (අ) රියදුරු බලපත්‍ර අංකය :———.
(ආ) රියදුරු බලපත්‍රය ලබාගත් දිනය :———.
(ඇ) ප්‍රවීණතාවය ලබා ඇති වාහන පංතිය :———.
(රියදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

11. අතිරේක සුදුසුකම් :———. (සහතික පත්වල ඡායා පිටපත් ඇමිණිය යුතුය)
12. විවාහක/අවිවාහක බව :———.
13. (අ) දැනට කරන රැකියාව :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක් ද ? :———.
14. ඔබට විශේෂ දක්ෂතාවයන් හෝ සුදුසුකම් තිබේ ද ? :———.
15. අයදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් (ඥාතීන් නොවන) :
(අ) ———.
(ආ) ———.
16. ඔබ මීට පෙර ශ්‍රී ලංකා පොලිස් සේවයේ සේවය කර තිබේ ද ?
:———.
එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.
18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.
(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

19. ඔබ කිසියම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම යම් වරදක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු යම් වරදක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් වරදක් සම්බන්ධයෙන් චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

21. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අදාළ නම් පමණි)
මෙම අයදුම්පත ඉදිරිපත් කරන ......................... මයා/ මිය/මෙනෙවිය .................... දෙපාර්තමේන්තුවේ/ සංස්ථාවේ/ මණ්ඩලයේ සේවයේ නියුතු අයෙකු බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් මුදා හැරිය හැකි බවත් ප්‍රකාශ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

තනතුර :———.
දිනය :———.

02-460/4

---

**ශ්‍රී ලංකා අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු**
**පිරවීම සඳහා වන බඳවා ගැනීම - 2017**

ශ්‍රී ලංකා අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වැනි ශ්‍රේණියේ පොත් බැඳුම්කරු තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පහත දැක්වෙන සුදුසුකම් ඇති තැනැත්තන් සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනීමට අධිකරණ සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

සුදුසුකම් : (i) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හා ගණිතය ඇතුළුව විෂයයන් 06 කින් සමත්ව, ඉන් විෂයයන් 03 කට සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය. එසේ වුවද මෙයින් විෂයයන් 05 කින් සාමාර්ථය එකම අවස්ථාවක ලබා තිබිය යුතුය.
(ii) වයස අවු. 17 ට නොඅඩු හා අවු. 30 ට නොවැඩි විය යුතුය.
දැනට රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදල නොවේ.

02. මසකට රු. 25,250/- 10x270 - 10x300 - 10x330 - 12x350 රු. 38,450/- ක වැටුප් පරිමාණයක් මෙම තනතුරට අයත් ය. (2020.01.01 දක්වා රා.ප.ච.03/2016 උපලේඛන II හි පරිදි වැටුප් ගෙවනු ලැබේ.
03. සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව සේවයට බඳවා ගැනීම සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් සේවා අවශ්‍යතාවය මත පුරප්පාඩු ඇති දිවයිනේ කවර ප්‍රදේශයක වුවද, අධිකරණවලට පත්කරනු ලබන අතර සේවා අවශ්‍යතාවය මත හැර වෙනත් කිසිදු හේතුවක් මත නියමිත කාලය අවසන් වන තුරු ස්ථාන මාරුකරනු ලැබීම සඳහා කරනු ලබන ඉල්ලීම් සළකා බලනු නොලැබේ.
04. මෙම තනතුරට ඉල්ලුම් කිරීම සඳහා වූ ආදර්ශ අයදුම්පතක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම නිවේදනයට අනුව 11 1/2" x 8 1/2" ප්‍රමාණයේ කඩදසියක සකස් කොට අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලව පමණක් අයදුම්කරුවන් විසින් තමන්ගේ අයදුම්පත් පිළියෙල කිරීම අවශ්‍ය වේ.
05. දැනට සේවයේ නියුතු ඉහත සඳහන් සුදුසුකම් ඇති අයදුම්කරුවන් තම අයදුම්පත් ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් එවිය යුතුය.
06. ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන ලද අපේක්ෂකයන්ගේ අයදුම්පත් 2017.03.03 වැනි දිනට හෝ එදිනට පෙර ''ලේකම්, අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය, කොළඹ 12.'' යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ ''අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වන ශ්‍රේණියට බඳවා ගැනීම'' යනුවෙන් සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
07. සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
08. අයදුම්පත් සම්බන්ධව පැන නගින ගැටලු සහ බඳවා ගැනීමේ දී පැන නගින ගැටලු පිළිබඳව අධිකරණ සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වනු ඇත.

ප්‍රදීප් ජයතිලක,
මහාධිකරණ විනිසුරු/වැඩ බලන ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 ජනවාරි මස 25 වැනි දින,
කොළඹ 12, අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය.

ශ්‍රී ලංකා අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු
පිරවීම සඳහා වන බඳවා ගැනීමේ අයදුම්පත්‍රය - 2017

1 (i) මුලකුරු සමග නම (සිංහලෙන්) : ———— . මයා/මිය/මෙනවිය
(ii) මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) : ———— .

2 මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්) : ———— .

3 (i) උපන් දිනය : ———— .
(ii) 2017.03.03 දිනට වයස : අවු : ———— මාස: ———— දින: ————

4 (i) ස්ථිර පදිංචි ලිපිනය : ———— .
(ii) දිස්ත්‍රික්කය : ———— .
5. ජාතික හැඳුනුම්පත් අංකය :———— .
6. දුරකථන අංක ඃ
(i) නිවස :————.(ii) ජංගම :———— .
7. අධ්‍යාපන සුදුසුකම්, අ. පො. ස (සා/පෙළ)
විභාග අංකය :———— . විභාග අංකය :———— .
වර්ෂය :———— . වර්ෂය :———— .

| අංකය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

| අංකය | විෂයයන් | සාමාර්ථය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

8. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :———— .
9. වෙනත් වෘත්තීය සුදුසුකම් ඇත්නම් :———— .

10. දැනට රැකියාවක නිරතවන්නේ නම් :———— .
(i) තනතුර හා ශ්‍රේණිය :———— .
(ii) තනතුර ස්ථිර කර තිබේද ? :———— .
(iii) දෙපාර්තමේන්තුව සහ වර්තමාන සේවා ස්ථානය :———— .

11. අධිකරණයකින් ඔබ යම් කිසි වරදකට වරදකරු වී තිබේද? එසේ නම් ඒ පිළිබඳව තොරතුරු කෙටියෙන් දක්වන්න :———.
මා විසින් ඉහත දැක්වූ සියලු තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය
.................... සේවය කරන ............................ මයා/මිය/මෙනවියට ශ්‍රී ලංකා අධිකරණ පොත් බැඳුම්කරු සේවයේ III වැනි ශ්‍රේණියේ තනතුරට ඉල්ලුම් කිරීමට අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් ඇති බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් දැනට දරන තනතුරෙන් මුද හරින බවද, ඔහුගේ/ ඇයගේ ඉල්ලුම් පත්‍රය නිර්දේශය කර මේ සමඟ ඉදිරිපත් කරමි.

දිනය :————. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන :——— .
මුද්‍රාව : ———— .

02 - 527

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (1)

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2017 මැයි මස කොළඹ දී පැවැත්වේ.

02. මෙම විභාගයට අදල විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන අංක 1925/37, 2015 ජූලි මස 28 වන දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනිකුත් විධිවිධාන පහත දක්වා ඇත.

නිලධාරියකුට මෙම කාර්යක්ෂමතා කඩඉම් විභාගයට නියමිත විෂයයන් සඳහා එකම වතාවකදී හෝ වෙන වෙනම අවස්ථාවලදී හෝ පෙනී සිටිය හැක.

(අ) විභාග පටිපාටිය - කාර්යක්ෂමතා කඩඉම් විභාගයේ විෂයන් පහත දැක්වේ. ඃ-
(i) විෂය අංකය 01 - සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු
ලකුණු 100 - කාලය පැය 1 1/2
(ii) විෂය අංකය 02 - මුදල් රෙගුලාසි
ලකුණු 100 - කාලය පැය 1 1/2
(iii) විෂය අංකය 03 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය
ලකුණු 100 - කාලය පැය 02
(iv) විෂය අංකය 04 - ඉංග්‍රීසි භාෂාව
ලකුණු 100 - කාලය පැය 02

විෂය නිර්දේශය
(i) සාමාන්‍ය කළමනාකරණය හා ආයතන කටයුතු
රජයේ ආයතන සංග්‍රහයේ i, ii, iii, iv, v, vii, viii, ix, xii, xiii, xiv, xxiv, xxviii, xxx සහ xxxi යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීති i, iii, iv, v, vi, viii හා xii යන පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

(ii) මුදල් රෙගුලාසි
රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 1 වැනි කොටසේ i, ii, v, viii, xii හා xiv පරිච්ඡේදයන්ට විශේෂ අවධානය ඇතිව

(iii) අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන නීතිය

අපේක්ෂකයින්ගෙන් පහත සඳහන් ආඥා පනත් හා පාර්ලිමේන්තු පනත් පිළිබඳව දැනුමක් අපේක්ෂා කෙරේ.
(i) 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (අධ්‍යාපනයේ නව මඟ)
(ii) 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාව
(iii) 1992 ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ පළමු වන වාර්තාව
(iv) 1997 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ
(v) 1999 සිට ක්‍රියාත්මක වූ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ (ප්‍රාථමික ද්විතියික හා අ. පො. ස. (උ.පෙළ))
(vi) 1976 අංක 15 දරන ප්‍රසිද්ධ විභාග (සංශෝධන) පනතින් සංශෝධිත 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත
(vii) 1986 අංක 28 දරන ජාතික අධ්‍යාපන ආයතන පනත
(viii) 1986 අංක 30 දරන අධ්‍යාපනික විද්‍යායතන පනත
(ix) 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත
(x) 1997 අංක 32 දරන ජාතික ගුරු අධ්‍යාපන අධිකාර්ය පනත
(xi) 13 වන සංශෝධනයට හා මූලික අයිතිවාසිකම් පිළිබඳ 3 වැනි පරිච්ඡේදයට විශේෂ අවධානය ඇතිව ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
(xii) අධ්‍යාපනයට අදාළ පළාත් සභා විසින් පනවා ඇති ප්‍රඥප්ති

(iv) English Language
(This is to assess the English Language Competence of the following subject areas.
- English Grammar - Tense and Number, Sentences (Simple/ Compound/ Complex/ Compound Complex), Relative Clauses, Adjectives and Adverbs, Prepositions
- Listening and Speaking Skills - General Greetings and Introductions, Giving and getting information, Advising, Suggesting and Expressing Opinions, Telephone Skills, Interviewing Skills, Meetings
- Writing Skills - Internal modes of Communication, Formal Correspondence skills, Writing Description/Explanations, Summery Writing skills, Report Writing skills.

*සැ. යු.*-අපේක්ෂකයින් විසින් කාර්යක්ෂමතා පරීක්ෂණය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයක් සඳහා යටත් පිරිසෙයින් ලකුණු 40%ක ප්‍රමාණයක් ලබා ගත යුතුය. අපේක්ෂකයෙකුට එක් අවස්ථාවකදී එක් විෂයකට හෝ ඊට වැඩි සංඛ්‍යාවකට පෙනී සිට සමත්විය හැකිය.

උපාධිය, පශ්චාත් උපාධි ඩිප්ලෝමාව හෝ පශ්චාත් උපාධිය ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරා ඇති විට මෙම කාර්යක්ෂමතා කඩඉම යටතේ ඇති ඉංග්‍රීසි විෂයය සමත්වීමේ අවශ්‍යතාවෙන් නිදහස් කරනු ලැබේ.

03. විභාගයේ භාෂා මාධ්‍යය
(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.
(ii) තරග විභාගයක් මගින් රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස තරග විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද, තරග විභාගයක් නොමැතිව රාජ්‍ය සේවයට ඇතුළු වූ අපේක්ෂකයකු නම් මෙම විභාගයේ භාෂා මාධ්‍යය ලෙස රජයේ සේවයට ඇතුළු වීමට සුදුසුකම් ලැබූ විභාගයට පෙනී සිටි භාෂා මාධ්‍යය ද තෝරා ගත යුතුය.

04. අපේක්ෂකයකු තමාට හිමිකම් නොමැති මාධ්‍යයකින් විභාගයට පෙනී සිටින බැව් හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

05. ''ඉල්ලුම්පත්‍රය මෙහි දක්වෙන ආකෘති පත්‍රයට අනුව ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ශීර්ෂ අංක 01 සිට 05 තෙක් ශීර්ෂ පළමු පිටුවටද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස සකසා ඉදිරිපත් කළ යුතුය. ''ඉල්ලුම්පත්‍රය පිළියෙල කිරීමේදී එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

06. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ලබන අතර විභාගය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති.

07. ඉල්ලුම්පත්‍ර 2017 වර්ෂයේ මාර්තු මස 17 හෝ ඊට පෙර ''විභාග කොමසාරිස් ජනරාල් සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව එවනු ලබන කවර හෝ ඉල්ලුම්පත්‍රයක් වුවද ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017(1)'' යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

08. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒබව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන් විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 03කට වත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා විභාග ගාස්තු ගෙවුයේ නම් එම මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපතද, අයදුම්පත තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සියද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඔබගේ ඉල්ලීම් ලිපියද, ෆැක්ස් මගින් යොමු කොට ශ්‍රී ලංකා දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායී වනු ඇත.

09. ඉහත 08 වැනි ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයන් විසින් පසුව ඉදිරිපත් කෙරෙන පැමිණිලි සලකා බලනු නොලැබේ.

10. අයදුම්පත්‍රයේද විභාග සඳහා වන ප්‍රවේශපත්‍රයේද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත යුතුය. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කිරීමට අපොහොසත්වන කිසිම අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

11. විභාග ශාලාවේදී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වන අතර ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතරින් කුමක් වුවත් වලංගු වේ.-
(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත ;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

12. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත්වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතුය.

13. මෙම විභාගයට පෙනී සිටින අපේක්ෂකයින් පහත සඳහන් පදනම මත විභාග ගාස්තු ගෙවිය යුතුය.-
(i) පළමු වතාවට විභාගයට පෙනීසිටින අයගෙන් සම්පූර්ණ විභාගය හෝ කොටසක් සඳහා ගාස්තු අය නොකෙරේ.
(ii) විභාගයට පෙනී සිටින්නේ පළමු වතාවට නොවන විට පහත සඳහන් පරිදි විභාග ගාස්තු අය කෙරේ.

| | |
|---|---|
| සම්පූර්ණ විභාගය සඳහා ගාස්තුව | රු. 500 කි. |
| එක් විෂයයකට | රු. 250 කි |

විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබා ගන්නා ලදුපත එහි එක් දරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැළවෙන ලෙස ඇලවිය යුතුය. තවද එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වේ. විභාග ගාස්තුව සඳහා මුදල් ඇනවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් කරනු නොලැබේ.

14. විභාගයට පෙනී සිටි සියළුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුලත් ලේඛනයක් ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ලබා දෙනු ඇත.

15. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් පළ කරන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් අනනුකූලතාවක් පවතීනම්, එවැනි විටක සිංහල මාධ්‍ය නිවේදනය නිවැරදි සේ සළකා කටයුතු කරනු ලැබේ.

16. මෙම විභාග නිවේදනය මගින් විධිවිධාන සළසා නොමැති කවර කරුණක් පිළිබඳව වුවද අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2017 ජනවාරි මස 25 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

**ඉල්ලුම්පත්‍රය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017 (1)
Efficiency Bar Examination for the Officers in Grade III of Sri Lanka Teacher Educators' Service-2017 (1)

ඉල්ලුම්පත්‍ර ''විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 1503, කොළඹ'' යන ලිපිනයට ආයතන ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කළ යුතුය. (විභාගයේ නම කවරයේ වමත් පස ඉහළ කෙළවරේ දැක්විය යුතුය.) නිලධාරියා විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :———.

02. (i) උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐
(ii) ජාතික හැඳුනුම්පත් අංකය ☐☐☐☐☐☐☐☐☐☐
(iii) ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

03. (i) පදවි නාමය :———.
(ii) සේවය කරන විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ.) :———.

04. පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :———.

05. නිවේදනයේ දෙවන ඡේදයේ (අ) යටතේ දක්වා ඇති විෂය අංකය හා විෂය සහිතව ගන්නා විෂයයන් පැහැදිලිව සඳහන් කළ යුතුය.

| *විෂයය අංකය* | *විෂයයේ නම* |
|---|---|
| | |
| | |
| | |
| | |

06. මීට ප්‍රථම මෙම විභාගයට සම්පූර්ණ ලෙස හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටියේද එසේ නම් එම විෂයයන් හා පෙනී සිටි වර්ෂය හා මාධ්‍යය සඳහන් කරන්න.

| *විෂයය* | *වර්ෂය* | *මාධ්‍යය* | *විභාග අංකය* |
|---|---|---|---|
| | | | |
| | | | |

07. විභාග ගාස්තු ගෙවීම අදාළ නම් ඊට අදාළ තොරතුරු :
(i) ලදුපත් අංකය :———.
(ii) ගෙවන ලද තැපැල් කාර්යාලය :———.
(iii) දිනය :———.

ලදුපත එහි එක් දරයක් මගින් මෙහි අලවන්න.

08. ඉහත දැක්වෙන විස්තර නිවැරදි බවත් *ගැසට්* නිවේදනයේ 03 වන ඡේදයට අනුව දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම එකඟ වෙමි.

———,
දිනය :———. අයදුම්කරුගේ අත්සන.

———
විභාග කොමසාරිස් ජනරාල්,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත් *ගැසට්* නිවේදනයේ 03 වැනි ඡේදයට අනුව ඔහු/ඇය දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් මම සහතික කරමි. අපේක්ෂකයා/අපේක්ෂිකාව විභාග ගාස්තුවෙන් නිදහස් බවද/නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවත් එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

———,
පීඨාධිපතිගේ/ගුරු විදුහල්පතිගේ/මධ්‍යස්ථානාධිපතිගේ
අත්සන හා පදවි නාමය
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදල නොවන වචන කපාහරින්න.)

02-505/2

---

**කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය**

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ උපදේශන නිලධාරි තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2016 (2017)

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ II ශ්‍රේණියේ උපදේශන නිලධාරි තනතුරු පුරප්පාඩු 03 ක් සඳහා (යාපනය, කිලිනොච්චිය හා මඩකලපුව) සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ගේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය :
මෙම විභාගයෙහි ලිඛිත කොටස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අතර ලිඛිත විභාග යේ ප්‍රතිඵල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්ගෙන් කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :
මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු, විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත්ය. උපදේශන නිලධාරි තනතුරට බඳවාගෙන වසර 03 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව තනතුරට බැඳී වසර 05 ක් ඇතුළත සේවාවට බැඳුණු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරින් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලටද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයටද, රජයේ මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලටද මෙම පත්වීම යටත් වේ.

03. අවශ්‍ය සුදුසුකම් :
3.1 අධ්‍යාපන සුදුසුකම් :
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් සමාජ විද්‍යාව පිළිබඳ හෝ මනෝ විද්‍යාව පිළිබඳ විශේෂ උපාධිය සමග උපදේශනය සම්බන්ධ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ රජයේ ලියාපදිංචි ආයතනයකින් එක් අවුරුදු ඩිප්ලෝමාවක් ලබා තිබීම.

3.2 පළපුරුද්ද
උපදේශනය පිළිබඳ වසරක පළපුරුද්ද

3.3 කායික සුදුසුකම්
සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා සහ තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.4 වෙනත් සුදුසුකම් :
i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. අයදුම්කරුවන් තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

04. වයස් සීමාව :
අයදුම්කරුවන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 21 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය. ඒ අනුව වයස සම්බන්ධ සුදුසුකම සපුරාලනුයේ අයදුම්කරුගේ උපන් දිනය 1996.03.09 දින හෝ ඊට පෙර හා 1982.03.09 දින හෝ ඊට පසුව යෙදී ඇත්නම් පමණි.

05. වැටුප් පරිමාණය :
මෙම තනතුරට රු. 34,605 - 10 x 660 - 11 x 755 - 15 x 930 - රු. 63,640 මාසික වැටුප් පරිමාණයක් හිමිය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි අංක MN 5-2016 වැටුප් කාණ්ඩය)

06. බඳවා ගැනීමේ ක්‍රමය :
ලිඛිත විභාගයට ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා මාධ්‍ය තුනෙන්ම පවත්වනු ලැබේ. ලිඛිත පරීක්ෂණයේ සියලු විෂයන් සමත් අයදුම්කරුවන් අතුරින් කුසලතා අනුපිළිවෙල මත ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන්, බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

6.1 ලිඛිත විභාගය

| ප්‍රශ්න පත්‍රය | කාලය | උපරිම ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 50 |
| සාමාන්‍ය දැනීම | පැය 01 | 100 | 50 |

6.2 විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| අභියෝග්‍යතා පරීක්ෂණය | පදගත, සංඛ්‍යාත්මක සහ රූපකාර සන්දර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුවන්ගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුවන්ගේ අවබෝධ කර ගැනීමේ හැකියාව හා බුද්ධිය මැනීම අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |
| සාමාන්‍ය දැනීම | ජාතික, කලාපීය හා ලෝකයේ විවිධ සංවිධාන පරිසරයන් තුළ පවතින සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, විද්‍යාත්මක, දේශපාලනමය, ආර්ථික සහ අනෙකුත් අදාළ සාධකයන් සම්බන්ධව අපේක්ෂකයා සතු දැනුම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයීම අනිවාර්ය වේ. |

6.3 සම්මුඛ පරීක්ෂණය :
ලකුණු ලබා දෙනු නොලැබේ. සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පමණක් පැවැත්වේ. (මෙම දැන්වීමේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබීම අනිවාර්යය වේ.)

6.4 ප්‍රතිඵල නිකුත් කිරීම :
ලිඛිත විභාගයේ ලකුණු පදනම් කර ගනිමින් කුසලතාවය මත සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results. exams. gov.lk වෙබ් අඩවියේ පළකරනු ඇත.

07. විභාග ගාස්තු :
මෙම විභාගය සඳහා ගාස්තුව රු. 400.00 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැර වන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයෙහි නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතු ය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු අයුරකින් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ කරනු නොලැබේ. විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

08. අයදුම්පත් පිළියෙල කිරීම
8.1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනය ගනිමින්,

(අ) අංක 1 සිට 3 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, ඉතිරිය අනෙක් පිටුවලට ද, වන ලෙස සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව සම්පූර්ණ කළ යුතු ය. අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යාවශ්‍ය වේ.

(ආ) නියමිත ආදර්ශ ආකෘතියට අදාළ නොවන, නියමිත දිනට විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතු වේ. ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8.2 මෙම විභාගය 2017 මැයි මාසයේ දී කොළඹ දී පවත්වනු ලැබේ.
8.3 නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින් එම නිවේදනයට අනුකූලව සකසා ඇති නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ.

8.4 අයදුම්පත් එවිය යුතු ආකාරය :
නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2017.03.09 දින හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ, යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු වේ. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහල කෙළවරේ "කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ උපදේශන නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2016(2017)" යන්න සඳහන් කළ යුතුය.

සටහන : ඉල්ලුම්පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානී අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතුය.

8.5 අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සමාදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු හෝ වාර්ෂික වැටුප රු. 2,92,080.00 ක් හෝ ඊට වැඩි රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික නිලධාරියෙකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

8.6 ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමා තුළ වන, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදාළ ලදුපත සමඟ අයදුම්කරුගේ අත්සන හා අත්සන සහතික කිරීමද, අදාළ නම් පමණක් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ද සහිතව නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනයේ සඳහන්, විභාගය පැවැත්වෙන දිනයට අවම වශයෙන් දින පහකටවත් පෙර තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක්ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින් විමසා සිටීම වඩාත් ඵල දායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදානමින් තබා ගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

8.7 අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයෙකුම විභාගයට ඉදිරිපත් වන පළමුවැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

09. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය
අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

10. සාවද්‍ය තොරතුරු සැපයීම :
අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා ගැසට් නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අසත්‍ය තොරතුරු සපයා ඇති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, ඔහු විසින් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් කෙරේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.
පත්වීම් ලබාදීම හා අනෙකුත් සියළුම කරුණු පිළිබඳව අවසන් තීරණය කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් සතු වන්නේය.

සටහන : මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය වලින් පළ වී ඇති නිවේදන වල කිසියම් පරස්පර විරෝධී බවක් ඇත්නම් නිවැරදි ලෙස සලකනු ලබන්නේ සිංහල භාෂාවෙන් පළ කර ඇති නිවේදනය බව කරුණාවෙන් සලකන්න.

චන්ද්‍රානි සේනාරත්න,
ලේකම්.

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය,
5 වන මහල,
සෙත්සිරිපාය II අදියර,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි

කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයේ ක්ෂේත්‍රගත/කාර්යාලගත බණ්ඩ 2 සේවා ගණයේ උපදේශන නිලධාරී තනතුරේ II ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2106(2017)

Open Competitive Examination For Recruitment For Counseling Officers, Grade II in Field/Office Based Officer - Segment 2 to the Ministry of Women and Child Affairs- 2016 (2017)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය :
සිංහල - 2 ( අදාළ අංකය කොටුව තුළ ලියන්න)
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4

---

01. 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
උද : HERATH MUDIYANSELAGE SAMANKUMARA GUNAWARDHANA
1.2 අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උද ා: GUNAWARDHANA, H. M. S. K.)
1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.
1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ | | | | | | | | | ]
1.5 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
පුරුෂ - 0

02. 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.
2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
2.4 දුරකථන අංකය :————.

03. 3.1 විවාහක/අවිවාහක බව :
විවාහක - 1 අවිවාහක - 2 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
3.2 උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]
3.3 අයදුම්පත් කැඳවන අවසාන දිනට වයස :
අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]
3.4 ඔබ ශ්‍රී ලාංකික පුරවැසියකු වන්නේ උපතින් ද? :————.
ලියාපදිංචියෙන් ද? :————.

04. 4.1 අධ්‍යාපන සුදුසුකම් :

| විශ්ව විද්‍යාලය | ලබා ඇති උපාධිය | උපාධිය වලංගු වන දිනය | විෂයයන් |
|---|---|---|---|
| | | | |

4.2 වෙනත් සුදුසුකම් :————.
4.3 පළපුරුද්ද :————.

05. ඔබ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකට දඬුවම් ලැබ තිබේද ? :————.
එසේ දඬුවම් ලැබ ඇත්නම් ඒ කුමන වරදක් සඳහා කවර අධිකරණයකින් කවර දඬුවමක් ලැබ ඇත් ද යන්න දක්වන්න. :————.

06. විභාග ගාස්තුව ගෙවූ ලදුපත පිළිබඳ විස්තර
i. විභාග ගාස්තු ගෙවූ තැපැල්/උප තැපැල් කාර්යාලයේ නම :
ii. කුවිතාන්සි අංකය හා දිනය : අංකය :————. දිනය :————.
iii. ගෙවූ මුදල :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.

07. අයදුම්කරුගේ සහතිකය :
මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් තොරතුරක් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්වීම ලැබීමට නුසුදුස්සකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු වුව ද සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

—————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :—————.

08. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................... මයා/මිය/මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු/ඇය ..................... වැනි දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

—————,
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :—————.

සහතික කරන නිලධාරියාගේ නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.

09. ආයතන ප්‍රධානියාගේ සහතිකය : රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.
මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ. ..................... ලෙස සේවය කරන අතර, ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කළ හැකිය.

—————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය :—————.
නම :—————.
තනතුර :—————.
ලිපිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)

02-503

---

**අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය 2017

අංක 1925/37 හා 2015 ජූලි මස 28 දිනැති ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සඳහා වන සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය 2017 අප්‍රේල් මස කොළඹදී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

02. ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සෑම නිලධාරියෙකුම බඳවා ගැනීමේ දින සිට වසර (03) ක් ඇතුළත සන්ධාන භාෂාව වන ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය. නිලධාරියෙකු අ.පො.ස. (සා.පෙ) විභාගයේ දී ඉංග්‍රීසි විෂයය සඳහා අවම වශයෙන් සම්මාන සාමාර්ථයක් හෝ ඊට වඩා ඉහළ සාමාර්ථයක් ලබා තිබේනම් හෝ ඉංග්‍රීසි මාධ්‍යයෙන් සේවයට බඳවාගෙන තිබේනම් මෙම සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය සමත් වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ. සෙසු නිලධාරීන් මෙම පරීක්ෂණය සමත් විය යුතුය.

03. මෙම විභාගයට අදළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1925/37 දරණ 2015 ජූනි මස 28 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා එම විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන පහත දක්වා ඇත.

(අ) විභාග පටිපාටිය - විෂය නිර්දේශය පහත පරිදි වේ.

| *විෂය අංකය* | *විෂය* | *ලකුණු* | *කාලය පැය* |
|---|---|---|---|
| 01 | ඉංග්‍රීසි භාෂාව | 100 | 02 |

විෂය නිර්දේශය
English Grammar

A suitable level of proficiency on the following forms of grammar in the spoken and the written language is expected frm the candidate.

- Tense and Number
- Sentences (Simple/Compound/Complex/Compound Complex)
- Relative Clauses
- Reported Speech
- Adjective and Adverbs
- Determiners
- Prepositions

(ii) Writing Skills

The knowledge on the modern formats and styles of writing is tested in this area of study.

- Essay Writing
- Summary writing skills
- Report writing skills
- Letter writing

(iii) Reading Skills

Candidate's ability to comprehend a printed text, infer meaning and written interpretation is expected.

- Reading and understanding the specific and general meaning of a printed text
- Reading and
- Interpretation (written)

04. සාමාර්ථය ලැබීම සඳහා මෙම විෂයයට අපේක්ෂකයකු අවම වශයෙන් 40% හෝ ඊට වැඩි ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.

4.1. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගාපේක්ෂකයින් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. මෙහි දක්වෙන ආකෘතියට අනුව ඒ4 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් ඉල්ලුම්පත්‍රය ශීර්ෂ අංක 01 සිට 04 තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවටද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර ඊට අදාළ තොරතුරු තම අත්අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව දන්වමි. තවද, සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප කරන බව වැඩි දුරටත් සඳහන් කරමි. ඉල්ලුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය බව දන්වමි.

06. විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පවත්නු ලබන අතර එය පැවැත්වීම සඳහා ඔහු විසින් පනවා ඇති නීති රීති පිළිපැදීමට අපේක්ෂකයෝ බැඳී සිටිති. විභාගය සඳහා වන නීති රීති මෙම නිවේදනය අවසානයේ පළ කොට ඇත.

07. ඉල්ලුම්පත් 2017 මාර්තු මස 09 වැනි දින හෝ ඊට ප්‍රථම විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ ලිපිනයට ලැබෙන පරිදි පීඨාධිපති/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් හෝ ඔබේ සේවා ප්‍රධානියා මගින් ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසු එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග (අදළ නම් පමණි) නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමුකොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02ක් හෝ 03ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දන්වීමේදී අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා අයදුම් කළ විභාගයේ නම සඳහන් කළ යුතුය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවිය හැකි ෆැක්ස් අංකයන් ද සහිත ඉල්ලීමේ ලිපියක් දන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසීම වඩාත් ඵලදායී වේ. විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන අවස්ථාවේ අවශ්‍ය වුවහොත් අයදුම්කරුගේ අපේක්ෂකත්වය තහවුරු කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීම අදළ වේ නම් ඒ සඳහා වූ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කරන ලද කුවිතාන්සියද සූදනමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. ඉහත 08 ඡේදයේ සඳහන් කර ඇති අවශ්‍යතාවන් සපුරාලීමට අපොහොසත් වන අපේක්ෂකයින්ගේ (පසුව ඉදිරිපත් කරනු ලබන) පැමිණිලි සලකා බලනු නොලැබේ.

09.1 අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතුය. විභාගයට පෙනී සිටින සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

10. විභාග ශාලාවේදී තමන්ගේ අනන්‍යතාව තහවුරු කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීම අපේක්ෂකයින්ගේ වගකීම වේ. ඒ සඳහා,
(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය, හෝ පමණක් පිළිගනු ලැබේ.

11. විභාග ගාස්තු :
(අ) මෙම විභාගය සඳහා අයකරන ලද ගාස්තු මොනයම් හේතුවක් මත හෝ ආපසු ගෙවනු නොලබන අතර වෙනත් විභාගයක ගාස්තුවකට මාරු කිරීමට ද ඉඩදෙනු නොලැබේ.
(ආ) පළමුවැනි වතාවේදී ගාස්තු අයකරනු නොලැබේ.
(ඇ) ඊට පසු එක් එක් වතාව සඳහා රු. 250.00 බැගින් අය කරනු ලැබේ.

මෙම විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂය 2003-02-13 ට බැරවෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා එවිය යුතුය. ලදුපතේ ඡයා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාර ගනු නොලැබේ.

12. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇති බව දන්වමි.

13. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතු ය.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2017 ජනවාරි මස 25 වැනි දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය සඳහා වූ සන්ධාන භාෂා (ඉංග්‍රීසි) පරීක්ෂණය 2017*

Link Language Examination for Sri Lanka Teacher Educators' Service - 2017

(පීඨාධිපති/ගුරු විද්‍යාල විදුහල්පති/ගුරු මධ්‍යස්ථාන කළමනාකරු මගින් විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503, කොළඹ වෙත ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කරන්න.
විභාගයේ නම කවරයේ වමත්පස ඉහළ කෙළවරේ සඳහන් කළ යුතුය.)

1. (i) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :—————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)
(ii) අගට යෙදෙන නම මුලින්ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :————.
(උදා: GUNAWARDHANA, H. M. S. K.)
(iii) සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2. (i) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ ශ්‍රේණිය :—————.
(ii) විද්‍යාපීඨය/ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථානය :—————.
(iii) කලාප අධ්‍යාපන කාර්යාලය :—————.
(ගුරු විද්‍යාලය/ගුරු මධ්‍යස්ථාන නිලධාරීන් සඳහා පමණි.)

3. ලිපිනය
(i) පෞද්ගලික :—————.
(ii) රාජකාරි :—————.
(iii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරින්)
(iv) රාජකාරි දුරකථන අංකය :—————.

4. (i) ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐
(ii) උපන් දිනය :—————.
වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐
(iii) ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 ☐
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

5. විභාග ගාස්තු ගෙවා ලබාගත් ලදුපතේ විස්තර :
ලදුපත් අංකය :—————.
තැපැල් කාර්යාලය :—————.
දිනය :—————.

ලදුපත මෙහි අලවන්න.

7. ඉහත සඳහන් තොරතුරු නිවැරදි බව ප්‍රකාශ කරමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මා එකඟ වෙමි.

—————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :—————.

8. විභාග කොමසාරිස් ජනරාල්,
ඉහත විස්තර දක්වෙන අපේක්ෂකයා මගේ විද්‍යාපීඨයේ/ගුරු විද්‍යාලයේ/ගුරු මධ්‍යස්ථානයේ නිලධාරියෙකු බව සහතික කරමි. තව ද අපේක්ෂකයා විභාග ගාස්තුවෙන් නිදහස් බවද/අපේක්ෂකයා විභාග ගාස්තු සඳහා වන ලදුපත නිවැරදිව අලවා ඇති බවද සහතික කරමි.

—————,
පීඨාධිපතිගේ/ගුරු විද්‍යාල විදුහල්පතිගේ/
ගුරු මධ්‍යස්ථාන කළමනාකරුගේ/
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සත.

ලිපිනය :—————.
දිනය :—————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න.)
(අදළ නොවන වචන කපා හරින්න.)

02-505/1

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී, (පුහුණු කිරීමේ ශ්‍රේණිය)

1.0 ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ඉහත සඳහන් තනතුර පුරප්පාඩු පිරවීම සඳහා මෙම නිවේදනයේ දක්වා ඇති අවම සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් විසින් අයදුම්පත් කැඳවනු ලබන අතර, සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) ප්‍රධාන කාර්යාලය වෙත අනුයුක්ත කෙරේ.

2.0 මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතියට අනුව ඒ4 කඩදාසියේ දෙපැත්ත භාවිතා කරමින් පිළියෙල කරන ලද අයදුම් පත්‍රයක් 2017.03.09 වැනි දිනට හෝ එදිනට ප්‍රථම "අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, 28/10, මලලසේකර මාවත, කොළඹ 07" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි "ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) තනතුරට බඳවා ගැනීමේ තරග විභාගය" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය. ප්‍රමාද වී ලැබෙන, අපැහැදිලි හා අසම්පූර්ණ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3.0 සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :

3.1 මෙම තනතුර ස්ථිර ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

3.2 රාජ්‍ය සේවයේ පත්වීම් සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ 11 පරිච්ඡේදයේ 10-12 දක්වා වගන්ති ද කාර්ය පටිපාටික රීති ද අදාළ වේ.

3.3 තෝරා ගනු ලබන අයදුම්කරුවන් ආයතන සංග්‍රහයේ විධිවිධානවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද, කලින් කළ රජය විසින් නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද යටත් විය යුතුය.

4.0 සාමාන්‍ය සුදුසුකම් :

4.1 ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

4.2 විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.

4.3 බඳවා ගන්නා නිලධාරින් දිවයිනේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට කැමති විය යුතුය.

4.4 ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 30 ට නොවැඩි විය යුතුය. (දැනට රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

5.0 අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

5.1 සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

හා

5.2 ක්ෂේත්‍රයට අදාළ විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත/තාක්ෂණවේදය විෂය ධාරාවට අයත් විෂයයන් තුනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

6.0 වෘත්තීය සුදුසුකම් :

6.1 ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)
ඉහත 5.0 හි අධ්‍යාපන සුදුසුකම්වලට අමතරව ක්ෂේත්‍රයට අදාළ පහත සඳහන් වෘත්තීය සුදුසුකම්වලින් එකක් සම්පූර්ණ කර ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසන් දිනය වන විට අදාළ සහතිකය ලබා තිබීම.

(i) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක පාඨමාලාවක් සාර්ථකව හදාරා ජාතික තාක්ෂණ සහතිකය ලබා තිබීම

හෝ

(ii) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක සැලසුම් ශිල්පය පිළිබඳ එක් අවුරුදු පූර්ණ කාලීන පුහුණු පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම

හෝ

(iii) රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක තනතුරට අදාළ ක්ෂේත්‍රයක කර්මාන්ත තාක්ෂණිකයන් සඳහා වූ ජාතික සහතික පත්‍ර පාඨමාලව සාර්ථකව සම්පූර්ණ කර අදාළ සහතිකය ලබා තිබීම

හෝ

(iv) උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම්වලට සියලු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

සටහන : ඉහත 5.0 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් හා 6.1හි සඳහන් සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) සඳහා නියමිත වෘත්තීය සුදුසුකම් සහිත අයදුම්කරුවන්, සේවයට අදාළ විෂය නිර්දේශය අනුව ලබා ගන්නා එක් වසරක න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව සාර්ථකව නිම කොට අදාළ විභාගය සමත් වීමෙන් පසු ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ තබනු ඇත.

7.0 තෝරා ගැනීමේ පදනම :

7.1 ලිඛිත තරග විභාගයේ කොන්දේසි :
මේ සඳහා වන ලිඛිත විභාගය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් මගින් පවත්වනු ලබන අතර, ඔහු විසින් දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතු වේ.

7.2 සුදුසුකම් සහිත අයදුම්කරුවන් ලිඛිත තරග විභාගයකට යොමු කරන අතර, සම්මුඛ පරීක්ෂණයට පෙනී සිටීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට අවම වශයෙන් 40%ක ලකුණු ප්‍රමාණයක් ලබා ගත යුතුය.
එම විභාගයේ ලකුණු ලබාගත් අනු පිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර සුදුස්සන් එම ලකුණු අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු නොලබන අතර සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ.

7.3 ලිඛිත තරග විභාගයට අදාළ විස්තර පහත පරිදි වේ.

| විෂයයන් | කාලය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | පැය 1 කි. | 100 | 40 |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | පැය 3 කි. | 100 | 40 |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අවබෝධ කර ගැනීමේ ශක්තිය, තර්කාණුකූල විචාර බුද්ධිය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව, සංඛ්‍යානමය හා ගණිතමය ගැටළු විසඳීමේ හැකියාව, භාෂා ඛණ්ඩ, වගු, පින්තූර, සටහන්, ප්‍රස්ථාර භාවිතය. |
| 02. විෂයානුබද්ධ තාක්ෂණික පරීක්ෂණය | සුදුසු පරිමාණයකට අනුව ගොඩනැගිලි සැලසුම් ඇඳීම හා සටහන් පිළියෙළ කිරීමේ හැකියාව |

7.4 ලිඛිත තරග විභාගය සිංහල/දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන්ම පවත්වනු ලැබේ.

8.0 බඳවා ගැනීම :
ඉහත 5.0සහ 6.0 යටතේ අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා ඇති ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)ට බඳවා ගනු ලැබේ.

9.0 වැටුප් පරිමාණය :
රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 3/2016 අනුව උපලේඛන V යටතේ

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)
රු.15,924/-(ගැලපුම් දීමනාව රු.9,914/-)

10.0 විභාග ගාස්තු :
විභාග ගාස්තුව රු.1,000 කි. අයදුම්කරුවන් විසින් ආපසු නොගෙවනු ලබන රු.1,000ක විභාග ගාස්තුවක් ශ්‍රී ලංකාව පුරා පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් මඟින් (උප තැපැල් කාර්යාල හැර) "SLIDA" ගිණුම වෙත ගෙවිය යුතු අතර, ඒ ගෙවීමට අදාලව ලබා දෙන රිසිට්පතේ අංකය විභාග අයදුම්පතේ අංක 12 යටතේ ඇතුලත් කළ යුතුයි.
ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී, මුදල් ලබා ගන්නා ලෙස "SLIDA" යන්න ද, ගිණුම වෙත මුදල් ගෙවීමේදී මුදල් යවන්නා ලෙස අයදුම්කරුගේ නම ද, මුදල් යවන්නාගේ ලිපිනය යන ස්ථානයේ අයදුම්කරුගේ ජාතික හැඳුනුම්පත් අංකය ද, ඇතුලත් කර ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුතුයි.

11.0 යම් අයදුම්කරුවෙකුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබීම හේතුවෙන් ඔහු/ඇය නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමෙන් හෝ තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුවහොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමටත් ඉඩ ඇත.

12.0 අත්සන සහතික කිරීම :
අයදුම්කරුවන් තම ආදර්ශ අත්සන, රජයේ පාසල් ප්‍රධානියකු/විශ්‍රාමික ප්‍රධානියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.240,360 හෝ ඊට වැඩි හෝ වාර්ෂික වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික නිලධාරියෙකු හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර පූජ්‍ය තත්ත්වයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයකු ලවා සහතික කරවා ගත යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අපේක්ෂකයන් සිය අයදුම්පත්‍රය ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.

මෙහි සඳහන් නොවන කරුණක් සඳහා තීරණ ගැනීමේ බලධාරියා ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වේ.

එම්.ආර්. ජෙයවන්ද්‍රන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්.

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

## ආදර්ශ අයදුම්පත්‍රය

### ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ, සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා.

ලිඛිත තරග විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :

සිංහල - S
දෙමළ - T [ ]
(අදාළ ඉංග්‍රීසි අකුර කොටුව තුළ ලියන්න.)

01. (i) සම්පූර්ණ නම :———.
(ii) මුලකුරු සමග නම(සිංහලෙන්/දෙමළෙන්) :———.
(iii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් සඳහන් කරන්න.) :———.

02. ලිපිනය හා දුරකථන අංක :
(i) කාර්යාලීය ලිපිනය :———.
දුරකථන අංකය :———.
(ii) පෞද්ගලික ලිපිනය :———.
(iii) දුරකථන අංකය :———. (iv) ජංගම දුරකථන අංකය :———.

03. ස්ත්‍රී/පුරුෂ භාවය :
පුරුෂ - 0
ස්ත්‍රී - 1 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

04. ජාතික හැඳුනුම්පත් අංකය : [ | | | | | | | | | ]

05. (i) උපන් දිනය : වර්ෂය [ | | | ] මාසය [ | ] දිනය [ | ]

(ii) ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු [ | ] මාස [ | ] දින [ | ]

06. විවාහක/අවිවාහක බව :
අවිවාහක - 1
විවාහක - 2 [ ]
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

07. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (පළමුවර) (කරුණාකර පිටපත් අමුණන්න.):

(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :———.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :———.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ........................... | ............... | ........................... | ............... |
| ........................... | ............... | ........................... | ............... |
| ........................... | ............... | ........................... | ............... |
| ........................... | ............... | ........................... | ............... |
| ........................... | ............... | ........................... | ............... |

08. අ.පො.ස. (සා/පෙළ) විභාගය පිළිබඳ විස්තර (දෙවැනි වර) අවශ්‍යනම් පමණක් (කරුණාකර පිටපත් අමුණන්න.)
(i) විභාගය සමත් වූ වර්ෂය සහ මාසය :———.
(ii) අයදුම්කරුගේ විභාග අංකය :———.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ........................... | ............... | ........................... | ............... |
| ........................... | ............... | ........................... | ............... |
| ........................... | ............... | ........................... | ............... |

09. අ.පො.ස. (උ/පෙළ) විභාගය පිළිබඳ විස්තර (කරුණාකර පිටපත් අමුණන්න.):
විභාගය සමත් වූ වර්ෂය :———. මාසය :———. දිනය :———.
අයදුම්කරුගේ විභාග අංකය :———.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| ........................... | ............... | ........................... | ............... |
| ........................... | ............... | ........................... | ............... |

10. අනෙකුත් සුදුසුකම්: තාක්ෂණ/වෘත්තීය (කරුණාකර පිටපත් අමුණන්න.) :———.

11. අදාළ ක්ෂේත්‍රය සම්බන්ධව ලබා ඇති පළපුරුද්ද :———.
ඉහත 10, 11 සඳහා සුදුසුකම් සනාථ කරන සහතිකවල පිටපත් ඇමුණුම් ලෙස ඉදිරිපත් කිරීම අනිවාර්යය බව සලකන්න.

12. විභාග ගාස්තු :

මුදල් ගෙවූ රිසිට් පත් අංකය [ S | L | D | | | | | | | | | | | | ]

රු.1,000ක් වන විභාග ගාස්තු ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න.
(කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

13. අයදුම්කරුගේ ප්‍රකාශයඃ

ඉහත සඳහන් තොරතුරු මා දන්නා පරිදි සත්‍ය හා නිවැරදි බව මම මෙයින් සහතික කරමි. තව ද, මෙහි ඇතුළත් කිසියම් තොරතුරක් අසත්‍ය හා සාවද්‍ය බව සොයා ගතහොත් එම සොයා ගැනීම තෝරා ගැනීමට පෙර සිදුවුවහොත් මා නුසුදුස්සකු වන බවත්, පත්වීම ලැබීමෙන් පසුව සොයා ගනු ලැබුවහොත් කිසිදු වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට ලක්වන බව ද දනිමි.

———,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :———.

14. අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන සහතික කිරිම ඃ

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන .................................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, ................. දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මෙයින් සහතික කරමි.

———,
සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :———.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :———.
තනතුර :———.
ලිපිනය :———.
නිල මුද්‍රාව :———.

රාජ්‍ය සේවයේ සිටින අයදුම්කරුවන් සඳහා පමණි

මෙම ඉල්ලුම්කරු වන .............................. මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ..................... වශයෙන් ස්ථිර/තාවකාලික/අනියම් සේවකයෙකු/සේවිකාවක ලෙස සේවය කරන බවත් ඔහු/ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

———,
ආයතන ප්‍රධානියාගේ අත්සන.
———,
(නිල මුද්‍රාව)

තනතුර :———.
දිනය :———.

02-377

# I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

## ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

### මහාධිකරණය - මහනුවර

මහනුවර මධ්‍යම පළාත්බඳ මහාධිකරණ කලාපයට අයත් පහත සඳහන් අධිකරණවල රාජසන්තක කරන ලද හා හිමිකම් නොපාන ලද රථවාහන ටෙන්ඩර් මගින් විකිණීම.

පහත සඳහන් නඩු අංක සහිත වාහන සඳහා ටෙන්ඩර්පත් 2017.03.06 වැනි දින දක්වා භාරගනු ලැබේ.

**මහෙස්ත්‍රාත් අධිකරණය - මහනුවර**

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහන අංකය* | *ආපසු ගෙවන ඇප තැන්පත් මුදල රු. ශත* |
|---|---|---|---|
| 01. | 83001/13 | 28 ශ්‍රී 8295 ලොරි රථය අබලි (ඉසුසු එල්ෆ්) | 2,000 0 |
| 02. | 95034/14 | 41 ශ්‍රී 4952 ලොරි රථය අබලි (ඉසුසු එල්ෆ්) | 2,000 0 |
| 03. | 89463/14 | UPPS 4011 ලොරි රථය (ෆෝටන්) | 5,000 0 |
| 04. | 9354/14 | CPGL - 1466 ලොරි රථය (ඉසුසු එල්ෆ්) | 10,000 0 |
| 05. | 82727 | CPLC - 1925 ලොරි රථය | 10,000 0 |
| 06. | 1716/15 | CPGC - 3351 ලොරි රථය (ටොයෝටා) | 10,000 0 |
| 07. | 35606 | CPQL - 0178 ත්‍රිවිලරය (බජාජ්) | 2,000 0 |
| 08. | AR 36654 | WPMM - 0022 යතුරු පැදිය (බජාජ්) | 2,000 0 |

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - දඹුල්ල :**

| | | | |
|---|---|---|---|
| 01. | 67321 | CP - PP - 1377 ලොරි රථය (ටාටා) | 5,000 0 |
| 02. | 62289 | 325-4143 ලොරි රථය (අශෝක් ලේලන්ඩ්) | 2,000 0 |
| 03. | 70696 | CPPV - 4086 ලොරි රථය | 5,000 0 |
| 04. | 18376 | 42- 1832 ලොරි රථය අබලි (ටාටා) | 2,000 0 |

ටෙන්ඩර් ඉල්ලුම්කරු අදළ වාහනයට අයත් ආපසු ගෙවනු ලබන ඇප තැන්පත් මුදල මහනුවර මහාධිකරණයේ තැන්පත් කළ යුතු අතර ආපසු නොගෙවනු ලබන රු. 100 ක මුදල ගෙවා ටෙන්ඩර් ඉල්ලුම්පත්‍ර හා විස්තර *ගැසට් නිවේදනයේ* පළවූ දින සිට 2017.03.03 වැනි දින ප. ව. 3.00 දක්වා ටෙන්ඩර් ඉල්ලුම්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට මහනුවර මහාධිකරණයේ ගිණුම් අංශයෙන් ලබාගත හැක.

මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, ගරු මහාධිකරණ විනිසුරු, මහාධිකරණය මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මහාධිකරණයට පැමිණ ගිණුම් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතු ය. ටෙන්ඩර්පත් බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''රථ වාහන සඳහා ටෙන්ඩර් කැඳවීම - 2017'' ලෙස හා වාහන අංකය පැහැදිලිව සඳහන් කළ යුතු ය.

ටෙන්ඩර්කරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුට කාර්යාල වේලාව තුළ අදළ අධිකරණයේ රෙජිස්ට්‍රාර්මහතා හමු වී තම අනන්‍යතාවය තහවුරු කර අදළ වාහන පරීක්ෂා කර බැලිය හැකි ය.

ටෙන්ඩර්පත් භාර ගැනීම 2017.03.06 වැනි දින පෙ. ව. 10.00 ට අවසන් වේ. තැපෑලෙන් ප්‍රමාද වී ලැබෙන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ. තව ද, තක්සේරු වටිනාකමට අඩුවෙන් ඉල්ලුම් කරන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප වේ.

ටෙන්ඩර්පත් භාර ගන්නා අවසන් දින ප. ව. 1.00 ට ටෙන්ඩර්කරුවන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් මහාධිකරණය මහනුවර වෙත පැමිණ සිටිය යුතු අතර එදින එම වේලාවට ටෙන්ඩර්පත් විවෘත කර මිල ගණන් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

අනතුරුව මහනුවර මහාධිකරණයේ ප්‍රසම්පාදන කමිටුව මගින් වැඩිම මිල ගණන් ඉදිරිපත් කළ ඉල්ලුම්කරුට ටෙන්ඩරය පිරිනැමීමට අවශ්‍ය කටයුතු කරනු ලබයි.

එම තීරණය අදළ අධිකරණයට දැනුම් දීමෙන් අනතුරුව වාහනයට අදළ මුදල ගෙවීමෙන් ටෙන්ඩර්කරුට හෝ බලය පැවරූ නියෝජිතයාට තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීමෙන් පසුව වාහනය මුදා හරිනු ලබන අතර එදිනම එය අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු වේ.

චෙක්පත් භාර නොගන්නා අතර මුදල් පමණක් භාර ගනු ලැබේ.

මෙම ටෙන්ඩරය සම්බන්ධයෙන් මහනුවර මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසාන තීරණය වේ.

මහාධිකරණ විනිසුරු,
ප්‍රසම්පාදන කමිටුවේ සභාපති,
මහාධිකරණය, මහනුවර.

2017 ජනවාරි මස 23 වැනි දින,
මහනුවර මහාධිකරණයේ දී ය.

02-450

---

### මහාධිකරණය - පොළොන්නරුව

රාජසන්තක කරන ලද ලොරි රථය ටෙන්ඩර් මගින් විකිණීම

හිඟුරක්ගොඩ දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ රාජසන්තක කරන ලද ලොරි රථය ටෙන්ඩර් කැඳවා විකිණීමට පොළොන්නරුව මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව තීරණය කර ඇත. විකිණීමට අදළ ලොරි රථය පහතින් දක්වා ඇති ස්ථානයේ දී 2017.02.10 දිනට පසු අදළ අධිකරණයේ රෙජිස්ට්‍රාර් මගින් පරීක්ෂා කිරීමට හැකියාව ඇත.

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *පරීක්ෂා කළ හැකි ස්ථානය* | *පරීක්ෂා කිරීම සඳහා අවසරය ලබාගත යුතු නිලධාරියා* |
|---|---|---|---|---|
| 01. | 19210 | ලියාපදිංචි අංක 68-8207 දරන ටොයොටා වර්ගයේ ලොරි රථය කොටස් කර විකිණීම | දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, හිඟුරක්ගොඩ | රෙජිස්ට්‍රාර් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය, හිඟුරක්ගොඩ. |

01. ටෙන්ඩර් ලියකියවිලි පොළොන්නරුව මහාධිකරණය මගින් 2017.02.10 වැනි දින සිට 2017.02.24 දක්වා නිකුත් කරනු ලැබේ.
02. ලංසු භාර ගැනීම 2017.02.27 වැනි දින ප. ව. 2.00න් අවසන් වේ.
03. ආපසු නොගෙවන ලද රු. 200 ක පෝරම ගාස්තුවක් හා ආපසු ගෙවන රු. 7,000 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ටෙන්ඩර් පෝරම ලබා ගන්නා අවස්ථාවේ දී පොළොන්නරුව මහාධිකරණයට ගෙවිය යුතු ය.
04. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම 2017.02.27 ප. ව. 2.30 ට පොළොන්නරුව මහාධිකරණයේ විවෘත අධිකරණ පරිශ්‍රයේ දී ලංසුපත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට පැමිණ සිටින ලෙස ලංසුකරුවන්ගෙන් හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.
05. ලංසුපත් සම්බන්ධයෙන් තීරණ ගැනීම ටෙන්ඩර් මණ්ඩලය සතු වේ.
06. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනවිත් භාරදීම කළ හැකි ය.

එච්. පී. ජී. එන්. රණවීර,
මහාධිකරණ විනිසුරු,
පොළොන්නරුව.

මහාධිකරණය,
පොළොන්නරුව.

02-352

---

**ඉඩම් අමාත්‍යාංශය**
ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**
**ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2017**

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිලි කුලියට ගැනීමට මිල ගණන් 2017.02.23 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| පළාත | දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය | මිල ගණන් භාර ගැනීම | ආසන්න නගරය | නිවස අවශ්‍ය දිනය |
|---|---|---|---|---|---|
| උතුරු පළාත | මුලතිවු | මුලතිවු | පළාත් සර්වේයර් ජනරාල් (උතුරු පළාත) පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, වවුනියාව. | මුලතිවු නගරය අවට | 2017.03.01 |

සපුරාලිය යුතු පොදු අවශ්‍යතා ඃ

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහළ වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2017.02.23 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2017 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ 05, කිරුළ පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2017
**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2017**

ගොඩනැගිලි අයිතිකරුගේ -
1. සම්පූර්ණ නම : ____________.
2. ලිපිනය : ____________.
3. දුරකථන අංකය : ____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : ____________.

ගොඩනැගිල්ල -
1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : ____________.
2. මාසික කුලී මුදල : ____________.
3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

02-315

මගේ අංකය : අවි/මහෙ/අධි/නඩු භාණ්ඩ වෙන්දේසිය/2017

**අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණය**

අයිතිකරුවන් මෙතෙක් ඉදිරිපත් නොවුන සහ රාජසන්තක කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොපාන ලද පහත සඳහන් භාණ්ඩ 2017.03.26 වැනි දින පෙරවරු 10.30 ට මෙම අධිකරණ භූමියේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවලට හිමිකම් පාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් විය යුතු ය.

3. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට පෙර විකිණීමට නියමිත භාණ්ඩ මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවල දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් එවලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලු ගෙවීම් මුදලින් කළ යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

6. වෙන්දේසියෙන් මිලදී ගන්නා ද්‍රව්‍ය සඳහා ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ටී. සරවනරාජා,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
අවිස්සාවේල්ල.

2017 ජනවාරි මස 23 වැනි දින,
අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**මහෙස්ත්‍රාත් අධිකරණය - අවිස්සාවේල්ල**

**රාජසන්තක කරන ලද, නඩු කටයුතු අවසන් වූ භාණ්ඩ හා හිමිකම් නොපාන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

වෙන්දේසි දිනය : 2017.03.26

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය | පිටු අංකය |
|---|---|---|---|---|
| 01. | 1535 | 12.05Kg ගෑස් සිලින්ඩර | 01 | 12-181 |
| | | ගෑස් ලිප් | 01 | |
| 02. | 2952 | 12.05Kg ලාෆ් ගෑස් සිලින්ඩර | 01 | 13-52 |
| | | ගෑස් ලිප් | 01 | |
| 03. | 4025 | 12.05Kg ගෑස් සිලින්ඩර් | 01 | 13-73 |
| | | කරාම 04 ගෑස් ලිප් | | |
| 04. | 4113 | 12.5Kg ෂෙල් ගෑස් සිලින්ඩර | 01 | 13-74 |
| | | ගෑස් ලිප් | | |
| 05. | 4785 | කරාම 04 ගෑස් ලිප් | 01 | 13 -98 |
| 06. | 5452 | සවල් | 01 | 13 - 121 |
| 07. | 5457 | යකඩ බාල්දි | 09 | 13 - 121 |
| 08. | 4651 | ඇළුමිනියම් මුට්ටි | 01 | 13 - 92 |
| 09. | 4823 | ගැරුම් වට්ටි | 01 | 13 - 99 |
| | | යකඩ බාල්දි | 01 | |
| 10. | 4824 | අඩි 05 පමණ දිග ඉල්ලන් කුරු | 01 | 13 - 99 |
| | | ලී මිට සහිත උදළු | 01 | |
| 11. | 4822 | ගැරුම් වට්ටි | 01 | 13 - 99 |
| 12. | 5024 | ඇළුමිනියම් මුට්ටි | 01 | 13 - 106 |
| 13. | 5463 | ලී මිට සහිත උදළු | 01 | 13 -122 |
| | | කුඩ | 02 | |
| 14. | 5437 | යකඩ බාල්දි | 01 | 13 - 122 |
| 15. | 5555 | රෙගියුලේටරය සහිත ගෑස් ලිප් | 01 | 13 - 123 |
| 16. | 5681 | ඇලුමිනියම් මුට්ටි | 01 | 01- 126 |
| | | ඇලුමිනියම් කළගෙඩි | 01 | |
| 17. | 6228 | ඇඳුම් උදළු | 01 | 13 -146 |
| 18. | 6229 | ඇඳුම් උදළු | 01 | 13 -146 |
| 19. | 6230 | ගැරුම් වට්ටි | 01 | 13 -146 |
| 20. | 5458 | වැලි සවල් | 01 | 13 -121 |
| | | යකඩ ඉනි | 01 | |
| 21. | 4786 | රෙගුලේටරය සහිත ගෑස් ලිප් | 01 | 13 -98 |
| 22. | 940 | රෙගුලේටරය සහිත ගෑස් ලිප් | 01 | 12 - 161 |
| 23. | 825 | පොරව | 01 | 12 - 159 |
| 24. | 824 | මන්නා පිහිය | 01 | 12 - 159 |
| 25. | 525 | බාල්දි | 01 | 12 - 146 |
| 26. | 819 | බාල්දි | 01 | 12 - 194 |
| 27. | 2152 | ජංගම දුරකථන | 01 | 13 - 108 |
| 28. | 2316 | නිල් පාට කුඩා ගෑස් සිලින්ඩරය | 01 | 13 -15 |
| | | හයිඩ්‍රොලික් ගෑස් ලිප් | 01 | |
| 29. | 2590 | වක්කා පිහිය | 01 | 13 - 22 |
| 30. | 2589 | වක්කා පිහිය | 01 | 13 -22 |
| 31. | 3086 | ඇඳුම් උදළු | 01 | 13 - 43 |
| 32. | 3087 | ඇඳුම් උදළු | 01 | 13 - 43 |
| 33. | 3191 | ඇඳුම් උදළු | 04 | 13 - 47 |
| | | යකඩ දුනු කොළ | 02 | |
| 34. | 3195 | ඇඳුම් උදළු | 02 | 13 - 47 |
| 35. | 5399 | 12.05Kg කහ පාට ගෑස් සිලින්ඩර | 01 | 13 - 150 |
| | | රෙගුලේටරය සහිත ගෑස් ලිප් | 01 | |
| 36. | 2901 | පිහිය | 01 | 13 -25 |
| 37. | 2588 | අත් පොරව | 01 | 13-22 |
| 38. | 2903 | වක් පිහිය | 01 | 13 - 33 |
| 39. | 97664 | UP වර්ගයේ පරිගණක යන්ත්‍ර | 01 | |
| | | LG වර්ගයේ ප්ලැට් ෆෝම් | | |
| | | මොනිටරය | 01 | |
| | | සුදුපාට මවුස් | 01 | 19-139 |
| | | කලුපාට යතුරු පුවරු | 01 | |
| | | වයර් කෝඩ් | 01 | |
| | | පරිගණක යන්ත්‍ර | 01 | |
| 40. | 7261 | 12.05 Kg ෂෙල් ගෑස් සිලින්ඩර් | 01 | 13-178 |
| | | ගෑස් ලිප් | 01 | |
| 41. | 7477 | යකඩ බාල්දි | 01 | |
| 42. | 7474 | සවල් | 03 | 13 - 185 |
| | | බාල්දි | 01 | |
| 43. | 7588 | යකඩ බාල්දි | 01 | 13 - 188 |
| 44. | 7591 | උදළු | 01 | 13 - 188 |

**බඩු බාහිරාදිය විකිණීම**

| අනු. අංකය | නඩු අංකය | විස්තරය | ප්‍රමාණය | පිටු අංකය |
|---|---|---|---|---|
| 45. | 7592 | ගැරුම් වට්ටි | 01 | 13 - 188 |
| 46. | 7596 | අත් කුඩ | 02 | 13 - 191 |
| 47. | 7799 | වැලි ගොඩ දමන බාල්දි | 02 | 13 - 196 |
| 48. | 10060 | වැලි ගොඩ දමන බාල්දි | 01 | 14 - 46 |
| | | සවල් | 01 | |
| 49. | 8349 | නිකල් පාට ඉලෙක්ට්‍රොනික් තරාදිය 01 | 14 - 63 | |
| 50. | 11125 | 12.05 Kg ෂෙල් ගෑස් සිලින්ඩරය | 01 | 14 -69 |
| | | රෙගුලේටරය සහිත ගෑස් ලිප් | 01 | |
| 51. | AR3786 | යකඩ ප්ලේට් | 03 | |
| | | යකඩ බාල්දි | 01 | |
| | | ගැරුම් වට්ටි | 02 | |
| | | රබර් ටියුබ් | 01 | AR2-7 |
| | | කැට කුඩ | 01 | |
| | | ඇඳුම් උදළු | 01 | |
| | | වානේ කේබල් | 01 | |
| 52. | AR3787 | යකඩ ප්ලේට් | 01 | |
| | | යකඩ දඹර කඳන් | 01 | AR2 - 7 |
| | | ඇඳුම් උදළු | 03 | |
| 53(i) | AR6706 | ෆයිබර් වලින් සාදන ලද ඔරු 02 | 01 | |
| | | කැට කුඩ | 02 | AR2 - 8 |
| | | කලුපාට ටියුබ් | 02 | |
| | | යකඩ කුරු | 01 | |
| 53(ii) | AR6706 | කැට කුඩ | 01 | |
| | | කොරහ | 02 | |
| | | කළගෙඩි | 01 | |
| | | රබර් ටියුබ් | 03 | AR2 - 8 |
| | | යකඩ බාල්දි | 06 | |
| | | අඩි 20 වානේ කේබල් | 01 | |
| | | බට කුඩ | 01 | |
| 53(iii) | AR6706 | ගැරුම් වට්ටි | 01 | |
| | | පොඩි උදළු | 01 | |
| | | යකඩ තාච්චි | 01 | AR2- 8 |
| | | ටියුබ් | 01 | |
| | | යකඩ බැරල් | 04 | |
| | | (02 බැගින් පැස්සුම් කර ඇත) | | |
| 53 (iv) | AR6706 | අංක 140684 කහපාට | 01 | |
| | | රොබින් වර්ගයේ පිස්ටනය | | |
| | | සවිකල කොම්ප්‍රෙෂර් මැෂින් | | |
| | | අංක 1126382 දරන තැඹිලි | 01 | |
| | | පාට රොබින් වර්ගයේ | | |
| | | පිස්ටනය සවිකල කොම්ප්‍රෙෂර් | 01 | AR2 - 8 |
| | | මැෂින් | | |
| | | දිග අඩි 08ක් ද, පළල අඩි 03ක් | 01 | |
| | | හා කම්බි කුරු 8 ක් සවිකල | | |
| | | යකඩ ප්ලේට් | | |
| | | දිග අඩි 04ක් ද, පළල අඩි 02ක් | 01 | |
| | | හා කම්බි කුරු 04ක් සවිකල | | |
| | | යකඩ ප්ලේට් | 01 | |
| | | දිග අඩි 18ක් වූ ගැල්වනයිස් බට | 04 | |
| | | යකඩවලින් සාදන ලද කැට කුඩ | 04 | |
| | | ගැරුම් වට්ටි | 04 | |
| | | රබර් ටියුබ් | | |
| 53(v) | AR6706 | ලොකු පුරුක් සහිත අඩි 7ක් දිග | 01 | |
| | | යකඩ දම්වැල් | | |
| | | කුඩා පුරුක් සහිත අඩි 7ක් | | |
| | | දිග යකඩ දම්වැල් | 01 | AR2 - 8 |
| | | අඟල් 02 පමණ ඉබ්බන් | 02 | |
| | | බෝල්ට් ඇණ | 12 | |
| 54. | AR100/17 | කොම්ප්‍රෙෂර් යන්ත්‍ර | 01 | |
| | | ඔක්සිජන් ටැංකි | 01 | |
| | | අඩි 70 දිග මවුත් එක හා මීටරය | 01 | AR2 - 8 |
| | | සහිත කහපාට ඔක්සිජන් බට | | |
| | | ටියුබ් | 01 | |
| | | ගැරුම් වට්ටි | 01 | |
| | | දිය යට බලන කණ්නාඩි | 01 | |
| 55. | 79991 | අඩි 04.09 උස ඔක්සිජන් | 01 | නි.වි.ම. |
| | | සිලින්ඩරය | | 9-61 |
| 56. | 11658 | ඇළුමිනියම් මුට්ටි | 02 | 14 -95 |
| 57. | 11503 | ලී මිට සහිත පිහිය | 01 | |
| | | කුඩ | 08 | |
| | | ප්ලාස්ටික් තාච්චි | 02 | |
| | | ගැරුම් වට්ටි | 02 | |
| | | උදළු | 01 | |
| | | ඉල්ලම් කුරු | 01 | |
| 58. | 11280 | ඇඳුම් උදළු | 01 | 14 |
| 59. | 11281 | ඇඳුම් උදළු | 01 | |
| | | යකඩ බාල්දි | 01 | 14 |
| 60. | | අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නිල මැදිරියෙන් හා විනිසුරු නිල නිවසින් ඉවත් කරන ලද භාණ්ඩ (පාවිච්චි කළ හැකි) | | |
| | | මුහුණ සෝදන බේසම් (අවපැහැ වූ) | 04 | |
| | | වැසිකිලි කොමඩ් (අවපැහැ වූ) | 05 | |
| | | ටියුබ් බල්බ් (අඩි 02) | 02 | |
| | | ටියුබ් බල්බ් (අඩි 04) | 02 | |
| | | සීලිං පෑන් | 01 | |
| | | අඩි 08 ඇලුමිනියම් වීදුරු ප්‍රේම් | 03 | |
| | | අඩි 08 ලී ජනෙල් | 03 | |
| | | ජනෙල් පියන් (වීදුරු සහිත) | 04 | |
| | | අබලන් ෆ්ලයිවුඩ් දොර පියන් (ලොක් සමග) | 03 | |
| | | අබලන් දොර පියන් | 02 | |
| | | පියන් දෙකේ දොර | 02 | |
| | | ජනෙල් පියන් (අබලන්) | 04 | |
| | | කැඩුණු වැහිපීලි තහඩු කැබලි | 03 | |
| | | යට ලී දඬු (දිරායමින් පවතින) | තොගයක් | |
| | | පරාල ලී දඬු (දිරායමින් පවතින) | තොගයක් | |
| | | බාල්ක ලී දඬු (දිරායමින් පවතින) | තොගයක් | |
| | | වහල ලී පොලු (දිරායමින් පවතින) | තොගයක් | |
| | | ෆ්ලයිවුඩ් දොර පියන් (අබලන්) | තොගයක් | |
| | | ඇස්බැස්ටෝස් රැලි තහඩු | තොගයක් | |
| 61. | | අවිස්සාවේල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාවිතයට ගත නොහැකි ලෙස නිර්දේශකර ඇති භාණ්ඩ | | |
| | | ඡායා පිටපත් යන්ත්‍ර (20733315) (Konica Minolta) | 01 | |
| | | UPS යන්ත්‍ර (B07M01000/2261A6) | 01 | |
| | | යතුරු ලියන (FACIT) | 01 | |
| | | මේස විදුලි පංකා | 01 | |
| | | මේස විදුලි පංකා (සීලිංKDK ) | 04 | |
| 62. | | අවිස්සාවේල්ල සිවිල් අභියාචනා මහාධිකරණයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව භාවිතයට ගත නොහැකි ලෙස නිර්දේශ කර ඇති භාණ්ඩ | | |
| | | විදුලි පංකා (පාදස්තල) | 02 | |
| | | විදුලි පංකා (සීවිලං) | 06 | |
| | | පරිගණක යන්ත්‍ර | 01 | |
| 63. | | අවිස්සාවේල්ල දිසා විනිසුරුතුමාගේ නිල කාර් රථයෙන් ඉවත්කරන ලද ටයර් (පාවිච්චි කළහැකි) | 08 | |
| 64. | | නඩු කිහිපයකට අයත් යකඩ බාල්දි තොගයක් | | |
| 65. | | නඩු කිහිපයකට අයත් ගැරුම් වට්ටි හා කුඩ කිහිපයක් | | |
| 66. | | නඩු කිහිපයකට අයත් හිස් වීදුරු බෝතල් තොගයක් | | |
| 67. | | නඩු කිහිපයකට අයත් කෑන් තොගයක් | | |
| 68. | | නඩු කිහිපයකට අයත් බූලි තොගයක් | | |
| 69. | | නඩු කිහිපයකට අයත් යකඩ බැරල් | | |
| 70. | | නඩු කිහිපයකට අයත් රබර් හෝස් තොගයක් | | |

07-343

---

**දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය- අත්තනගල්ල, නිට්ටඹුව**

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ හා අධිකරණ කාර්යාලයේ භාවිතයෙන් ඉවත් කරන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාලව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද නඩු භාණ්ඩ 2017.02.25 වැනි දින පෙ. ව. 10.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වෙන දින එය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

3. අධිකරණ රෙජිස්ට්‍රාර්වරයාගෙන් නිසි අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට පෙර වෙන්දේසියේ නියමිත භාණ්ඩ ගැණුම්කරුවන්ට පරීක්ෂාකර බැලිය හැකිය.

4. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා ඉල්ලුම්කරු විසින් වෙන්දේසි අවස්ථාවේ දී ම මුදල් ගෙවිය යුතු අතර, සියලු ගෙවීම් මුදලින් පමණක් ගෙවිය යුතු ය. මේ සඳහා චෙක්පත් භාරගනු නොලබන අතර, මිල දී ගත් භාණ්ඩ එදින ප. ව. 3.00 ට පෙර ඉවත්කර ගත යුතු ය.

5. වෙන්දේසියෙන් මිල දී ගන්නා ද්‍රව්‍යයන් සඳහා ගැණුම්කරුවන් විසින් තමාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පිළිගත හැකි හැඳුනුම්පත් ඉදිරිපත් කළ යුතු ය.

6. වෙන්දේසිය අවස්ථාවේ දී අධිකරණය විසින් තබනු ලබන ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල දී ඉදිරිපත්කළ භාණ්ඩ සම්බන්ධව අවසන් තීරණය ගරු අධිකරණයේ අභිමතය පරිදි සිදුකරන බව දන්වා සිටිමි.

එස්. ඒ. අයි. එස්. සුරවීර,
දිසා/විනිසුරු මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත්, අධිකරණය
අත්තනගල්ල, නිට්ටඹුව.

2017 ජනවාරි මස 23 වැනි දින,
අත්තනගල්ල දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | 04831 | නිල්පාට ගෑස් සිලින්ඩර් 01 |
| 02. | 06257 | නිල්පාට ගෑස් සිලින්ඩර් 1 හා ගෑස් ලිප් 01 |
| 03. | 09867 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 04. | 06458 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 05. | 13103 | ගෑල් ලිප් 01 හා ප්ලාස්ටික් බේසම් 01 |
| 06. | 14847 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 07. | 14849 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 08. | 14075 | ගෑස් සිලින්ඩර් 02 හා ගෑස් ලිප් 02 හා බේසම් 01 |
| 09. | 14078 | නිල්පාට ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 හා බේසම් 01 |
| 10. | 16159 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 11. | 13208 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 12. | 83988 | ගෑස් සිලින්ඩර් 02 හා ගෑස් ලිප් 02 |
| 13. | 19959 | ගෑස් සිලින්ඩර් 04 හා ගෑස් ලිප් 01 |
| 14. | 22370 | සාස්පාන් 01 |
| 15. | 01215 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 16. | 13753 | ටෝච් 01 |
| 17. | 13771 | දුරකථන චාර්ජර් |
| 18. | 13776 | ළමා පාවහන් යුගල 01 |
| 19. | 08114 | හෙඩ් ෆෝන් සෙට් 01 |
| 20. | 95592 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 21. | 00694 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 22. | 09416 | ගෑස් සිලින්ඩර් 01 හා ගෑස් ලිප් 01 |
| 23. | 08334 | ගෑස් සිලින්ඩර් 01 |
| 24. | 12755 | ගෑස් සිලින්ඩර් 01 |
| 25. | 12449 | ගෑල් ලිප් 01 |
| 26. | 26072 | ගෑස් සිලින්ඩර් 01 |
| 27. | AR/464/16 | අංක 75F1 සිංගර් වර්ගයේ වතුර මෝටරය<br>අංක F2023 දරන සෙන්ට්‍රික් වතුර මෝටරය |
| 28. | AR/465/16 | අංක අපැහැදිලි පාපැදි 01 |
| 29. | AR/1831/15 | අංක රහිත පාපැදි 01 |
| 30. | AR/1832/15 | අංක අපැහැදිලි පාපැදි 01 |
| 31. | AR/1833/15 | අංක රහිත මවුන්ටන් පාපැදි |
| 32. | AR/1834/15 | අංක FD7K0437 දරන Amazon Sport වර්ගයේ<br>පාපැදි 01 |
| 33. | 81564 | අංක 43-8221 දරන ලොරි රථය<br>අබලි ද්‍රව්‍ය ලෙස) |
| 34. | 73908 | අංක 25 ශ්‍රී 1303 ට්‍රැක්ටරය (අබලි ද්‍රව්‍ය |
| | ලෙස) | |
| 35. | 55664 | 100-6648 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 36. | 87693 | WPXC 8170 යතුරු පැදිය |
| 37. | 24748 | 68-4463 දරන ලොරි රථය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 38. | AR/2204/15 | 105 ශ්‍රී 3894 යතුරු පැදිය |
| 39. | AR/2147/15 | WPMZ 0730 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 40. | AR/967/11 | 88-4304 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 41. | AR/1056/10 | WPMC 5929 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 42. | AR/491/10 | 105 - 910 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 43. | AR/489/10 | අංක රහිත යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 44. | AR/922/10 | 151-5120 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 45. | AR/1550/15 | WPVY 4669 යතුරු පැදිය |
| 46. | AR/1835/15 | අංක රහිත යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 47. | AR/490/10 | 90 ශ්‍රී 9519 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 48. | AR/492/10 | 90-5843 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 49. | AR/1299/13 | WPTS 9816 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 50. | AR/1108/10 | 145-5282 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 51. | AR/139/11 | NW - ML 2652 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය |
| | ලෙස) | |
| 52. | AR/129/11 | 100-5723 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 53. | AR/1733/05 | 108-3360 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 54. | AR/1863/03 | 145-3237 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 55. | AR/650/02 | අංක රහිත යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 56. | 58196 | WPHA 2360 දරන ත්‍රිරෝද රථය |
| 57. | AR/864/05 | 142-9749 යතුරු පැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 58. | AR/1084/04 | 112-9438 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 59. | AR/1007/02 | 136-2798 යතුරුපැදිය (අබලි ද්‍රව්‍ය ලෙස) |
| 60. | AR/16/11 | 14 - 8611 දරන කාර් රථය (අබලි ද්‍රව්‍ය |
| | ලෙස) | |
| 61. | AR/273/14 | අංක රහිත කුබෝටා අත් ට්‍රැක්ටරය (අබලි<br>ද්‍රව්‍ය ලෙස) |
| 62. | AR/658/16 | 1. ටිපර් රථයක බොනට් එක<br>2. ටිපර් රථයක බෆර් කෑලි 03<br>3. ටිපර් රථයක ජොයින්ට් පොල්ල<br>4. කලුපාට ඩීසල් ටැංකිය |
| 63. | AR/1630/16 | අංක රහිත පාපැදි 01 |
| 64. | AR/1629/16 | අංක රහිත පාපැදි 01 |
| 65. | අංක රහිත | හිස් ප්ලාස්ටික් කෑන් තොගය |
| 66. | අංක රහිත | හිස් වීදුරු බෝතල් තොගය |
| 67. | අංක රහිත | හිස් බැරල් තොගය |

**භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයෙන් වෙන්දේසියට නියම කළ බඩු වට්ටෝරු පොතට අදාළ වෙන්දේසි කිරීමට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

2015 භාණ්ඩ සමීක්ෂණ අනුව බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කළ භාණ්ඩ

| | | |
|---|---|---|
| 01. | අල්මාරි වානේ | 03 |
| 02. | කැබිනට් වානේ ලාච්චු 4 | 03 |
| 03. | කැල්කියුලේටර් ලොකු | 02 |
| 04. | කැල්කියුලේටර් කුඩා | 01 |
| 05. | කතුරු | 05 |
| 06. | ජෝගු විදුලි | 01 |
| 07. | බංකු ඇඳි සහිත | 02 |
| 08. | පුටු ඇඳි සහිත | 08 |
| 09. | සිවිලින් ෆෑන් | 07 |
| 10. | විධායක පුටු | 01 |
| 11. | මේස ලිපිකරු | 03 |
| 12. | මේස යතුරු ලියන | 01 |
| 13. | මේස පරිගණක | 01 |
| 14. | වයර් කෝඩ් | 02 |
| 15. | සේප්පු | 01 |
| 16. | ස්ටේප්ලර් මැෂින් | 04 |
| 17. | පරිගණක පුටු | 03 |
| 18. | පරිගණක මේස | 02 |

තත්ත්ව පරීක්ෂණ වාර්තාව අනුව බඩු වට්ටෝරු පොතෙන් ඉවත් කළ භාණ්ඩ :

| | | |
|---|---|---|
| 01. | දුරකථන | 02 |
| 02. | විදුල කේතල | 01 |
| 03. | පරිගණක ස්පීකර් | 02 |
| 04. | පරිගණක මවුස් | 02 |
| 05. | ෆැක්ස් මැෂින් | 02 |
| 06. | පරිගණක බැටරි | 04 |
| 07. | පරිගණක මවුස් | 05 |
| 08. | දිරාපත් වූ වානේ කබඩ් | 01 |
| 09. | දිරාපත් වූ මේස කෑබලි | |
| 10. | ලිපිකරු මේස | 01 |
| 11. | මුදල් පෙට්ටියක කොටස් | |

නව ගොඩනැගිල්ල ඉදිකිරීමේ දී පැරණි ගොඩනැගිල්ලෙන් ඉවත් කරන ලද ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ

| | | |
|---|---|---|
| 01. | දෙර උළුවහු 1ක් හා උළුවහු කොටස් කීපයක් | |
| 02. | අල්මාරි පියන් | 05 |
| 03. | ලොකු දෙර පියන් | 03 |
| 04. | කුඩා දෙර පියන් | 04 |
| 05. | බල්බ් ආවරණ | 13 |
| 06. | සිවිලිං ෆෑන් | 11 |
| 07. | කොමඩ් කොටස් කීපයක් | |
| 08. | සින්ක් | 02 |
| 09. | සිටුවන ලද විදුලි පංකා කොටස් | |
| 10. | ටියුබ් ලයිට් | |

02-356

---

# රජයේ නොවන දැන්වීම්

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

නිට්ටඹුව, පනාවල අංක 35 හි පදිංචි කදඹළුවා පතිරන්නැහැලාගේ වරුණ ලසන්ත (ජා. හැ. අ. 721083381 V) වන මා විසින් හිරිවඩුන්න, රන්දෙණිය දරන ස්ථානයේ හි පදිංචි ආරච්චි අප්පුහාමිලාගේ සනත් ප්‍රේමාලාල් (ජා. හැ. අ. 580644430 V) යන අය මාගේ ඇටෝර්නි බලකරු වශයෙන් පත් කරන ලද ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් රුවනි ජයවර්ධන විසින් ලියා සහතික කළ අංක 187 සහ 2008 මැයි මස 20 වැනි දිනැති ඇටෝර්නි බලපත්‍රය අවලංගු කොට බලරහිත කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන ලද බව මෙයින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙමි. මින් මතු එකී ඇටෝර්නි බලපත්‍රය මත එකී ඇටෝර්නි බලකරු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවක් හෝ ගණුදෙනුවකට මම කිසිදු වගකීමක් නොදරන බව මෙයින් දැනුම් දෙමි.

කේ. පී. වරුණ ලසන්ත.

02-329

---

## පුද්ගලික සීමාසහිත සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ නිවේදනය.

සමාගමේ නම : ලන්ටානා ටී (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 107927
සංස්ථාගත කළ දිනය : 2015 අගෝස්තු 25
ලියාපදිංචි ලිපිනය : අංක 298/21, 2 වන පටුමග, මන්ඩාවිල පාර, පිළියන්දල.

සමාගම් අධ්‍යක්ෂක.

02-355

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කොටුගොඩ, රද්දොළුව, නිවාස යෝජනා ක්‍රමය පාරේ, අංක 365/2 හි පදිංචිව සිට දැනට ඇමරිකා එක්සත් ජනපදයේ පදිංචි ශ්‍රීමති අනෝමා ලියනපතිරණගේ වන මා විසින් මගේ නීත්‍යානුකූල ඇටෝර්නි බලකාරිය වශයෙන් කොටුගොඩ, රද්දොළුව, ජාතික නිවාස යෝජනා ක්‍රමය පාරේ, අංක 355/2 හි පදිංචි පද්මා රාමණායක යන අය පත් කරන ලද රේනුකා කන්දගේ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 1997.06.19 වැනි දින ලියා සහතික කරන ලද අංක 96 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් පවරන ලද ඇටෝර්නි බලය අවලංගු කරන ලද බව මෙයින් දන්වා සිටිමි.

ශ්‍රීමති අනෝමා ලියනපතිරණගේ.

02-354

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සජාන් ඉංජිනියර්ස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 119107
ලියාපදිංචි කාර්යාලය : අංක 136/1, ඊරියවැටිය පාර, කැලණිය
ලියාපදිංචි දිනය : 2017.01.02

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පීවීටී) එල්ටීඩී.

02-347

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : හෙල දිරි ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118899
ලියාපදිංචි කාර්යාලය : අංක 281/1, එපිටගෙදර, විල්කටුපොත, වාරියපොල.
ලියාපදිංචි දිනය : 2016.12.22

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පීවීටී) එල්ටීඩී.

02-348

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කොට ඇති බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : සිනරෝමා ටුවර්ස් (පී වී ටී) එල් ටී ඩී
සමාගමේ අංකය : පී වී 118878
ලියාපදිංචි කාර්යාලය : අංක 280/සී, පන්නල පාර, දන්ඩගමුව, කුලියාපිටිය
ලියාපදිංචි දිනය : 2016.12.22

වෝටර්ස් සෙකටේරියල් සර්විසස් (පීවීටී) එල්ටීඩී.

02-349

---

## 2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්ති ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාගත කර ඇති බව නිවේදනය කරනු ලැබේ

සමාගමේ නම : සොලුසියස් කන්සල්ටිං ලංකා (පී වී ටී) එල් ටී ඩී
ලියාපදිංචි අංකය : පී වී 101272
සංස්ථාගත කළ දිනය : 2014.10.02
ලියාපදිංචි ලිපිනය : අංක 9/45, 3 වැනි පටුමග, වුඩ්ලන්ඩ් ඇවනියු, කොහුවල, නුගේගොඩ.

සමාගමේ නම : අර්බන් ග්‍රීන් වෙන්චර්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පී වී 119258
සංස්ථාගත කළ දිනය : 2017.01.09
ලියාපදිංචි ලිපිනය : අංක 912 ඒ, පහළවෙල පාර, තංලගම දකුණ, බත්තරමුල්ල.

ගෙස්ට්මන් කෝපරේට් කන්සල්ටන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්.

02-363

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 9 වැනි වගන්තියට අනුව පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බවට අපි මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : කැෂ්වැගන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119395
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 47, ඇලෙක්සැන්ඩ්‍රා පෙදෙස, කොළඹ 7
සංස්ථාගත කළ දිනය : 2017.01.16

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

02-364

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තියට අනුව, පහත සඳහන් සමාගමෙහි නම 2017 ජනවාරි 06 වනදා සිට ක්‍රියාත්මක වන පරිදි වෙනස් කර ඇති බව මෙයින් දන්වා සිටිමු.

සමාගමේ පැරණි නාමය : ඩයලොග් ටෙලිවිෂන් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 2635
සමාගමේ ලියාපදිංචි කළ කාර්යාලයීය ලිපිනය : අංක 475, යුනියන් පෙදෙස, කොළඹ 02
සමාගමේ නව නාමය : ඩයලොග් ඩිවයිස් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්

ඩයලොග් ඩිවයිස් ට්‍රේඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්,

සමාගම් ලේකම්.

02-367

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීමේ නිවේදනය මෙයින් ප්‍රකාශයට පත් කෙරේ.

සමාගම් නාමය : සැට්මෝ කන්සල්ටන්ට්ස් (පීවීටී) එල් ටී ඩී
සමාගම් ලියාපදිංචි අංකය : පී වී 119514
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 55/9 ඒ, පළමු පටුමග, කුඹුක්ගහ පොකුණ පාර, උඩුහමුල්ල, නුගේගොඩ.
සංස්ථාපනය කරන ලද දිනය : 2017 ජනවාරි 20

සමාගම් ලේකම්.

02-371

---

## සමාගමේ නම වෙනස් කිරීම පිළිබඳව කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගමේ 8 (1) ඒ (2) සහ 3 වගන්තිවලට අනුව සමාගමේ නම වෙනස් කර සමාගම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ කලින් පැවති නම : මෙඩිමාර්කට් ඩිස්ට්‍රිබියුටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 76927
ලියාපදිංචි ලිපිනය : අංක 364/4, පොල්හේන පාර, කැලණිය
සමාගමේ නව නාමය : ස්ටේඩ්ෆාස්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ක්‍රියාත්මක කළ දිනය : 2016 සැප්තැම්බර් මස 13 වැනි දින

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

මයිඩාස් සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

02-375

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගම 2017 ජනවාරි මස 06 වැනි දින ස්ථාපිත කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමේ නම : සීරොඩේ සෙකියුරිටි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119232
ලියාපදිංචි කාර්යාලය : අංක 50, සියඹලාගස්තැන්න පාර, මහනුවර

එකවුන්ටින් සිස්ටම්ස් සෙක්‍රටේරියල්
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

03 වන මහල, අංක 11, කාසල් පටුමග,
කොළඹ 04.

02-378

---

## නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සමාගමක් නාමය වෙනස් කිරීම පිළිබඳ දැන්වීම

සමාගමේ නව නාමය : සයින්වර්ල්ඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ පෙර නාමය : සයිනේප් වර්ල්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්
නාමය වෙනස් කළ දිනය : 2016.12.14
ලියාපදිංචි අංකය : පී වී 105310
ලියාපදිංචි කළ දිනය : 2015.04.28
ලියාපදිංචි ලිපිනය : අංක 60බී 1, හෝකන්දර පාර, තලවතුගොඩ.

සමාගම් ලේකම්.

02-381

**දැනුම්දීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ ප්‍රකාරව පහත නම් සඳහන් සමාගම 2017 ජනවාරි මස 16 වැනි දින සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නාමය : ලොජිං පාට්නර් සර්විසස් සිලෝන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119389
ලියාපදිංචි ලිපිනය : අංක 9/5, තඹබයියා ඇවනියු, කොළඹ 7

ජේසී ඇන්ඩ් කම්පැනි,
කම්පැනි සෙක්‍රටරීස්.

අංක 9/5, තඹබයියා ඇවනියු,
කොළඹ 07.

02-415

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරනු ලැබේ.

නම : Retro Grinding Mills (Private) Limited
PV No. : PV 108465
දිනය : 2015.09.17
ලියාපදිංචි ලිපිනය : 211, Mosque Road, Napawala, Avissawella.

Centra Management Consultant.

02-416

---

**දැන්වීමයි**

කේ ඇන්ඩ් ටී ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, 2016 ජනවාරි මස 06 වැනි දින සංස්ථාගත කළ බව, 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ. එය සමාගම් අංක පීවී 111054 දරන අතර එහි ලියාපදිංචි කාර්යාලය අංක 62, නුවර පාර, දලුගම, කැලණිය හි පිහිටා ඇත.

ලේකම්.

02-417

---

**ප්‍රසිද්ධ නිවේදනය**

2007 අංක 07 දරන සමාගම් පනතේ (9) 1 වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : එන් එම් ටෙක්ස්ටයිල්ස් ලංකා (පී වී ටී) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119423
ලියාපදිංචි කාර්යාලය : 2/68, පරාක්‍රම මාවත, පානදුර

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
සමාගම් ලේකම්.

02-418

---

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සැලෝටා ඉංජිනියරිං ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 113030
ලියාපදිංචි ලිපිනය : අංක 83/1, කොස්වාන උතුර, කයිකාවෙල, මාතලේ.
ලියාපදිංචි කළ දිනය : 2016 අප්‍රේල් 08.

ලේකම්.

02-436

---

**සංස්ථාපනය කිරීම පිළිබඳ දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය ප්‍රකාරව කරනු ලබන නිවේදනය.
සමාගම් නාමය : ඉඩෝරා කෝපරේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 96596
සංස්ථාපනය කරන ලද දිනය : 2014 ජනවාරි 21
ලියාපදිංචි කාර්යාලයීය ලිපිනය : අංක 10, පැරකුම් මාවත, අත්තිඩිය, දෙහිවල.

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

02-456

---

**ඇටර්නි බලපත්‍රය අහෝසි කිරීම**

හික්කඩුව, කිරහන්දිගොඩ, පංසල පාර, අංක 04 පදිංචි, නලින්ද දීපාල් වරුස විතාන වන මම විසින් හික්කඩුව, අමරසේන මාවත, පදිංචි මහමදච්චි අනුර කුමාර යන අය මාගේ ඇටර්නි බලකරු වශයෙන් පත්කරන ලද වර්ෂ 2015 ක් වූ දෙසැම්බර් මස 11 වැනි දින දරන රංජනී ඊ. කළුපහන ප්‍රසිද්ධ නොතාරිස් විසින් සහතික කරන ලද අංක 28793 දරන ඇටර්නි බලපත්‍රය අහෝසි කරන බව මෙයින් දැනුම් දෙමි.

02-462

---

**එස් ජී අයි ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්, කොග්ගල මැනුෆැක්චරින් (ප්‍රයිවට්) ලිමිටඩ්, ඇලයර් ඇපරල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, ෆෙයාමවුන්ට් ෆැෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්, ෆෙයාමවුන්ට් ඇපරල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සහ ලිඩිං ලේඩි ඉන්ටිමේට්ස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගම් ස්ටාර් ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගමට ඒකාබද්ධ කිරීම**

ඒකාබද්ධ කරනු ලබන සමාගම් වන එස් ජී අයි ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් (PV 4350) කොග්ගල මැනුෆැක්චරින් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (PV 4099), ඇලයර් ඇපරල් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (PV 15944), ෆෙයාමවුන්ට් ෆැෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (PV 77994) ෆෙයාමවුන්ට් ඇපරල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් (PV 78001) සහ ලිඩිං ලේඩි ඉන්ටිමේට්ස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ් (PV 66709) යන සමාගම් 2007 අංක 7 දරන සමාගම් පනතේ 239 වන වගන්තිය ප්‍රකාරව එක් නෛතික අස්ථිත්වයක් ලෙස ස්ටාර් ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම සමඟ ඒකාබද්ධ කරනු ලබන අතර එකී ස්ටාර් ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් ඒකාබද්ධිත සමාගම ලෙස පවතිනු ඇත.

ඉහත කී ඒකාබද්ධ කිරීම 2007 අංක7 දරන සමාගම් පනතේ 241 වන වගන්තියට අනුකූලව 2017 ජනවාරි මස 23 වැනි දින පැවැත්වීමට නියමිත අති විශේෂ මහා සභා රැස්වීමක දී සියළු සමාගම්වල කොටස් හිමියන් විසින් අනුමත කරනු ලැබීමට යටත් වන්නේ ය.

ඒකාබද්ධ කිරීමේ යෝජනාව කොටස් හිමියන් වෙත ඉදිරිපත් කරනු ලබන අතර එය අනුමත කරනු ලැබුවහොත් 2017 අප්‍රේල් මස 1 වැනි දින හෝ සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබිය හැකි පසු දිනයක සිට බලාත්මක කරනු ලැබිය හැකි ය.

ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපත් යම් කොටස් හිමියකු සුරක්ෂිත කළ ණය හිමියෙකු හෝ මහජනතාව විසින් පරීක්ෂා කිරීම සඳහා එම යෝජනාවේ පිටපත් සාමාන්‍ය ගනුදෙනු කරන කාලය තුළ කොළඹ 3 යුනිටි පෙදෙසේ අංක 1 ඒ, දරන ස්ථානයේ තබනු ලබන අතර ඒකාබද්ධ කිරීමේ යෝජනාවේ පිටපතක් ඉල්ලා සිටීමේ දී නොමිලයේ ලබාගත හැකි ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. ජී. අයි. ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
.............................
සමාගම් ලේකම්.

කොග්ගල මැනුෆැක්චරින් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
.............................
සමාගම් ලේකම්.

ඇලයර් ඇපරල් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
.............................
සමාගම් ලේකම්.

ෆෙයාමවුන්ට් ෆැෂන් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
.............................
සමාගම් ලේකම්.

ෆෙයාමවුන්ට් ඇපරල්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
.............................
සමාගම් ලේකම්.

ලීඩිං ලේඩි ඉන්ටිමේට්ස් ලංකා (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
.............................
සමාගම් ලේකම්.

ස්ටාර් ගාමන්ට්ස් (ප්‍රයිවෙට්) ලිමිටඩ්,
.............................
සමාගම් ලේකම්.

02-495

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : සොල් ලංකා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119385
ලියාපදිංචි කාර්යාලය : අංක 346, ගාලු පාර, හික්කඩුව
ලියාපදිංචි කළ දිනය : 2017.01.20

සමාගමේ ලේකම්වරු.

02-507

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : පවර්මැටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119456
ලියාපදිංචි කාර්යාලය : අංක 458, නුවර පාර, කැළණිය
ලියාපදිංචි කළ දිනය : 2017.01.18

සමාගමේ ලේකම්වරු.

02-508

---

**නිවේදනයයි**

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : ස්කයිස්ජෙට් ඒවියේෂන් ලිමිටඩ්
සමාගම් අංකය : පී බී 5373
ලියාපදිංචි කාර්යාලය : අංක 121/3, කිරුළපන ඇවනිව්, කොළඹ 5
සංස්ථාපනය කළ දිනය : 2017.01.10

සමාගම් ලේකම්.

02-509

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් පනතෙහි 9 (1) වගන්තියට අනුව පහත සඳහන් සමාගම (ඇපයෙන් සීමිත) සංස්ථාගත කිරීම මෙයින් නිවේදනය කෙරේ.

සමාගමේ නාමය : පොසිටිව් යුත්
සමාගමේ ලියාපදිංචි අංකය : ජී. ඒ. 3269
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 277/7, පරණ නුවර පාර, දළුගම, කැලණිය
සංස්ථාගත කළ දිනය : 2016 දෙසැම්බර් 08 වැනි දින.

පොසිටිව් යුත්,
සමාගම් ලේකම්.

2017 ජනවාරි මස 10 වැනි දින.

02-522

---

**නිවේදනයයි**

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සවි සිංහ බිල්ඩර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119566
සමාගමේ ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 07, සෙනෙවිරත්න පාර, හැඳල, වත්තල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
නදිශනි මල්ලවාරච්චි.

02-526

---

**ඇටෝර්නි බලය අවලංගු කිරීම පිළිබඳ දැන්වීම**

කරවෙට්ටි, වතිරි, සින්නෝය පුලම් දනට අංක 16, Pin Lane , Scarborough, Ontario MIJ 0A6 ස්ථානයේ පදිංචි සභාරත්නම් කනගසබයිගේ වැන්දඹු වන නාගරත්නම් සභාරත්නම් සහ පුතා වන නවරත්නරාජා සභාරත්නම් (Nagartnam Sabaratnam Widow of Sabaratnam Kanagasabai and son Navaratnarajah Sabaratnam) යන අප විසින් ටොරොන්ටෝ ප්‍රසිද්ධ නොතාරිස් සොලිසිටර් සහ බැරිස්ට්‍රර් මාර්ටිනස් රෆායෙල් මහරාජා (Martinus Raphael Maharaja) මහතා විසින් වර්ෂ 2016.09.08 වැනි දින ලියා සහතික කරන ලද රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය 2017.01.05 වැනි දින සිට අවලංගු හා බල රහිත ශුන්‍ය ලේඛනයක් බව මෙයින් සියලු දෙනාගේ ම දැන ගැනීම පිණිස දන්වන අතර, එකී බලපත්‍රය යටතේ මාගේ නිත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් කරවෙට්ටි වතිරි, සින්නෝ ය පුලම් හි පදිංචි සින්නතුරයි නඩරාජා (Sinnathurai Nadarajah) ජාතික හැඳුනුම්පත අංකය (511150418 V) යන අයට මා වෙනුවෙන් ක්‍රියා කිරීමට ලබා දී ඇත්තාවූ බලය වර්ෂ 2017.01.05 වැනි දින සිට අහෝසි වන බව සියලු දෙනා ම මෙයින් දැන ගත යුතු වේ.

සභාරත්නම් කනගසබයිගේ වැන්දඹු වන
නාගරත්නම් සභාරත්නම් සහ පුතා වන
නවරත්නරාජා සභාරත්නම්.
(NAGARATNAM SABARATNAM
WIDOW OF SABARATNAM
KANAGASABAI AND SON
NAVARATNARAJAH
SABARATNAM)

2017 ජනවාරි මස 05 වැනි දින,

02-528

---

**2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය අනුව පහත සඳහන් සමාගමේ නම 2015 සැප්තැම්බර් 08 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එහි නම වෙනස් කළ බවට කරනු ලබන ප්‍රසිද්ධ දැන්වීමයි**

සමාගමේ කලින් තිබූ නම : සියෙරා ඉන්ෆොමේෂන් ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී බී 241පීවී
ලියාපදිංචි ලිපිනය : අංක 112, හැව්ලොක් පාර, කොළඹ 05
සමාගමේ නව නාමය : සියෙරා ටෙක්නොලොජි හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

අධ්‍යක්ෂ මණ්ඩලය අණ පරිදි,

පී. ආර්. සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අධ්‍යක්ෂක.

02-533

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : තහරා ෆවුන්ඩේෂන්
සමාගමේ අංකය : ජී ඒ. 3280
සංස්ථාගත කළ දිනය : 2016.12.30
ලිපිනය : අංක 10, ඇල්බට් ක්‍රෙසන්ට්, කොළඹ 07.

සමාගම් ලේකම්.

02-546/1

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන සමාගම් ආඥපනතේ 9 (1) වගන්තිය ප්‍රකාර කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : ග්‍රීන් ආර්ට් සොලූෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119240
සංස්ථාගත කළ දිනය : 2017.01.06
ලිපිනය : අංක 10, ඇල්බට් ක්‍රෙසන්ට්, කොළඹ 07.

සමාගම් ලේකම්.

02-546/2

---

## වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දේවමැදි හත්පත්තුවේ, උඩුකහ කෝරළයේ වීරඹුගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාවේ, අංක 871 දරන උතුරු මඩවල ග්‍රාම නිලධාරි වසමේ, මඩවල ගමේ පිහිටි මඩවල එස්ටේට් නමැති ඉඩමට, බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් මැන සාදන ලද අංක 3209 සහ 2010.07.25 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබැලි අංක 1 දරන බිම් කොටස (බලයලත් මිනින්දෝරු එස්. එම්. දිසානායක විසින් මඩවල එස්ටේට් නමැති ඉඩමට මැන සාදන ලද අංක 2108 A සහ 2001.02.10 දින දරන පිඹුරේ නිරූපිත කැබැලි අංක 1 සහ 5 දරන ඉඩම් කැබලිවල ඒකාබද්ධ කිරීමක් වන) බිම් කොටස

ප්‍රමාණය (අ. 0 රූ. 0 පර්. 30) පර්චස් තිහක් විශාල ඉඩම් කැබැල්ල. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ V 01/111 යටතේ ලියාපදිංචි කර ඇත.

ප්‍රසිද්ධ නොතාරිස් පනාවලගේ නිලන්ති බර්නඩෙත් විසින් සහතික කරන ලද අංක 10489 සහ 2014.08.19 දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ඉහත උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනදායී වශයෙන් අබේසිංහ මුදියන්සේලාගේ ජයන්ත අබේසිංහ යන අය බන්ධනදායී වශයෙන්, කොළඹ 02 යුනියන් පෙදෙසේ අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදායී විසින් පැහැර ඇති හෙයින්,

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2017ක් වූ පෙබරවාරි මස 27 වැනි දින පෙ. ව. 11.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම. - කුරුණෑගල නගරයේ සිට මීගමුව පාරේ කි. මී. 8.7පමණ ගමන් කළ විට කොට්ටගස්පිටිය හන්දිය හමුවේ. එතැන් සිට දකුණට හැරී කීනගස්පිටිය පාරට හැරී කි. මී. 1.4ක් පමණ ගමන් කරන විට අදාළ දේපළ වම් පසින් හමුවේ.

ගෙවීම් කළ යුතු ආකාරය .- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතු ය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02. ඉතිරි සියයට අනුව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04. පළාත් පාලන අයබදු සියයට එකයි (1%),
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%,
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,

07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න. නීති දෙපාර්තමේන්තුව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී, අංක 242 යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකථන අංක : 011 4218745

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ, තක්සේරුකරුවෝ සහ
උසාවි කොමසාරිස්වරු, කොළඹ වාණිජ
මහාධිකරණ සහ දිසා අධිකරණය
බලයලත් වෙන්දේසිකරුවෝ රාජ්‍ය වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12,
දුරකථන අංක : 077-3181891.

02-444

---

**ඩී එෆ් සී සී බැංකුව පීඑල්සී**
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදනය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අංක 39/1634/43 දරන උකස්කරය යටතේ උකස්කරන ලද දේපළ පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාවට අයත් ග්‍රෑන්ඩ්පාස් දකුණ කොට්ඨාස අංක 14 පිහිටි අංක 39, කෙත්තාරාම මාවත යන ලිපිනය දරන බලයලත් මිනින්දෝරු එස්. රාසප්පා විසින් මැතකදී සාදන ලද 2009 නොවැම්බර් මස 25 වැනි දිනැති අංක 485/2009 දරන පිඹුරේ ලොට් අංක 3ඒ ලෙස දැක්වෙන (කලින් අංක 1850 දරන පිඹුරේ ලොට් අංක 3 ලෙස පැවති ඉඩමේ) සීමා නිර්ණය කර බෙදා වෙන්කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 0 රූඩ් 0 පර්. 4.92 එහි පිහිටි සියල්ල සහිතව

පිළිවෙලින් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සජිනි බස්නායක කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඇන් එස්. ගනේගොඩ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සජිනි බස්නායක විසින් සහතික කරන ලද 2011 ජනවාරි මස 12 දිනැති 2011 ජනවාරි මස 18 දිනැති සහ 2011 ජනවාරි මස 18 දිනැති අංක 38/1633/42 සහ 39/1634/43 දරන සංගාමී උකස්කරයන් ප්‍රකාර කොළඹ 14, ඊට් මෝර් රෙස්ටෝරන්ට් නම් හවුල ව්‍යාපාරය පවත්වාගෙන යන කොළඹ 14 පදිංචි මොහොමඩ් සරූක් මොහොමඩ් ෆකුර්ඩීන් සහ ෆාතිමා රුසානා ෆකුර්ඩීන් හෙවත් ෆාතිමා රුසානා ආරිෆ් හෙවත් ෆලීල් ආරිෆ් පාතුමා රුෂානා යන අය විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදුව, ගෙවීම්වලදී පොරොන්දු නිසියාකාර ව ඉෂ්ට නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 පෙබරවාරි මස 28 වැනි දින (අඟහරුවාදා) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

ගෙවීමේ ක්‍රමය. - මිල තීන්දු වූ වහා ම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2 (සියයට දෙකහමාර),
4. රු. 74,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි''

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක් එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

ප්‍රධාන කාර්යාලය :
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

02-441

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම නගර සභා සීමාව තුළ (මහරගම ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයේ අංක 528 A දරන දඹහේන ග්‍රාම නිළධාරී වසමේ) සල්පිටි කෝරළයේ පල්ලේ පත්තුවේ පන්නිපිටිය ගමේ පිහිටි තල්ගහලන්දේවත්ත නමැති ඉඩමට, බලයලත් මිනින්දෝරු එස්. ඒ. ඩබ්ලිව්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 648 සහ 2003.06.03 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබැල්ල අංක 1 දරන බිම් කොටස ප්‍රමාණය (අ: 0 රූඩ්: 0 පර්: 16.90) පර්චස් දහසයයි දශම නවයයි බිංදුවක් විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ පළතුරු ආදී සෑම සියළු දේ සමගය.

තවද ඉහත කී ඉඩමට මෙහි පහත විස්තර කරන ඉඩමේ මාර්ග අයිතිය ද සමග වේ.
ඉහත කී පන්නිපිටිය ගමේ පිහිටි තල්ගහලන්දේවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. ජේ. නානායක්කාර විසින් මැන සාදන ලද අංක 1429 සහ 1969.06.20 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබැලි අංක A ප්‍රමාණය (අ:.0 රූඩ්. 0 පර්. 31) පර්චස් තිස් එකක් විශාල ඉඩම් කැබැල්ල ප්‍රසිද්ධ නොතාරිස් ඉෂාරා දිලුමිණි වීරක්කොඩි විසින් සහතික කරන ලද අංක 2421 සහ 2015.01.02 වැනි දින දරණ උකස් බැඳුම්කරය ප්‍රකාරව ඉහත උපලේඛනයේ හි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනාදායී වශයෙන් දහනායක ලියනගේ නිහාල් සමන් යන අය බන්ධනාදයී වශයෙන්, කොළඹ 02, යූනියන් පෙදෙස, අංක 242 හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනාදායී විසින් පැහැර ඇති හෙයින්, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, 2017 ක් වූ මාර්තු මස 03 වන දින පෙ. ව. 10.00ට අදාළ දේපළ පිහිටි ස්ථානයේ දී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- කොළඹ සිට හයිලෙවල් පාරේ මහරගමට පැමිණ වමට ඇති පන්සල පාරට හැරෙන්න. එකී පන්සල පාරේ මීටර් 650 පමණ ගමන් කර විට දකුණට ඇති රණවිරු අතුල මාවතට හැරී තවත් මීටර 60 ක් පමණ ගමන් කරන විට අදාළ දේපළ වම් පසින් පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය.- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01. ගැණුම් මිලෙන් සියයට දහයක් 10%
02. ඉතිරි සියයට අනූව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.
03. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%)
04. පළාත් පාලන අය බදු සියයට එකයි (1%)
05. ප්‍රචාරක වියදම් සහ අනිකුත් වියදම් 100%
06. ලිපිකරු හා සෝෂක වේතනය රු. 1000/-
07. නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2000/-

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිළධාරින්ගෙන් විමසන්න - නීති දෙපාර්තමේන්තුව,නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී එල් සී, අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02.
දුරකතන අංක : 0114218745.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ
තක්සේරුකරුවෝ සහ උසාවි කොමසාරිස්වරු,
කොළඹ වාණිජ මහාධිකරණ සහ දිසා
අධිකරණය බලයලත් වෙන්දේසිකරුවෝ
රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩ්‍රෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකතන අංක : 077-3181891

02-443

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**
1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී., විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2017 ක් වූ මාර්තු මස 07 වැනි දින ප.ව. 01.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තලවතුගොඩ ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ තලවතුගොඩ පිහිටි කෝන්ගහවත්ත නැමැති ඉඩමට (බලයලත් මිනින්දෝරු පී.ඩබ්. පතිරණ විසින් මැන සාදන ලද වර්ෂ 1990.01.18 දිනැති පිඹුරු අංක 1005 දරන පිඹුරෙහි දැක්වෙන ඉඩමෙහි නැවත මැනීමක් වන) බලයලත් මිනින්දෝරු පී. ඩබ්. පතිරණ විසින් මැන සාදන ලද වර්ෂ 2007/07/08 දිනැති පිඹුරු අංක 2464 දරන පිඹුරේ ලොට් 7 දරන ඉඩම් කැබැල්ල නැමැති ඉඩම සහ එහි පිහිටි ඉඩම සහ එහි පිහිටි සියලු දෙය වේ.

(අ:0, රූ:0, පර්:9.55)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී.සී.ද ෆොන්සේකා විසින් සහතික කරන ලද වර්ෂ 2015 ක්වූ අගෝස්තු මස 14 වැනි දිනැති අංක 1236 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම බන්ධනදයි ලෙස නිමාවින් ඩිවලපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් ද උකස්කරු ලෙස දුමින්ද ලංකා ලියනගේ විසින් පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා .-වර්ෂ 2017/01/20 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය ද වර්ෂ 2017.01.20 වැනි දිනැති ලක්බිම, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත් ද බලන්න.

දේපළට පිවිසෙන මාර්ගය.- තලවතුගොඩ හන්දියේ සිට තලවතුගොඩ පිටකෝට්ටේ පාර දිගේ මීටර් 400 ක් පමණ ගිය විට වම් පසින් ඇති වැලි පාරට හැරී මීටර් 300ක් පමණ ගොස් එතැනින් වමට ඇති පොදු පාරේ මීටර් 50ක් පමණ ගිය විට මෙම ඉඩම වම්පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය .- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.
(01) ගැනුම් මුදලෙන් 10%ක් ද (සියයට දහයක්)
(02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද (සියයට දෙකහමාරක්)
(04) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද
(05) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද රු.3000.

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90%ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුව අයිතිය ඇත.

අදළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අයකර ගැනීමේ අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාළු පාර, කොළඹ 03.

දුරකථන: 011-4667218/011-2565573

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ
බලයලත් වෙන්දේසිකරු.

අංක 182/3 (50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන අංක: 011-3068185, 2572940

02-506/1

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී., විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ වර්ෂ 2017 ක් වූ මාර්තු මස 07 වැනි දින පෙ.ව. 11.00 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, කුඹුකේ පත්තුවේ, රයිගම් කෝරළේ (නැගෙනහිර) හොරණ ප්‍රාදේශීය සභා සීමාව තුළ, හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, කිදෙල්ලමුලහේන අංක 616 E ග්‍රාම නිළධාරි කොට්ඨාසය තුළ උඩුව සහ මුණගම ග්‍රාමයේ පිහිටි වල්ජම්බුවෙහේන *හෙවත්* වවුලුගල තේ වතුයාය නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්.එල්.එන්.පෙරේරා විසින් මැන සාදන ලද වර්ෂ 2011.02.26 දිනැති අංක 6260 දරන පිඹුරේ ලොට් 1A දරන කැබැල්ල නැමැති ඉඩම සහ එහි පිහිටි ඉඩම සහ එහි පිහිටි සියලු දෙය වේ.

(අ: 5, රූ: 2, පර්: 0.44)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී.සී.ද ෆොන්සේකා විසින් සහතික කරන ලද වර්ෂ 2014 ක්වූ අගෝස්තු මස 20 වැනි දිනැති අංක 944 දරන උකස්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම බන්ධනදායී/උකස්කරු ලෙස නිමාවින් ඩිවලපර්ස් ප්‍රයිවට් ලිමිටඩ් විසින් පැහැර හැර ඇති හෙයින්ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා - වර්ෂ 2017.01.20 වැනි දිනැති රජයේ *ගැසට් පත්‍රයද*, වර්ෂ 2017.01.20 දිනැති ලක්බිම, දි අයිලන්ඩ් සහ තිනක්කුරල් පුවත් පත්ද බලන්න.

දේපළට පිවිසෙන මාර්ගය.- හොරණ සිට රත්නපුර පාර ඔස්සේ කි.මී. 1 1/2 ක් ගිය විට වමට ඇති අයි.ඩී.බී. ඉන්ඩස්ට්‍රියල් එස්ටේට් වෙත දිවෙන වවුලුගල පාරට හැරී කි.මී. 1 1/2 ක් ගිය විට මෙම ඉඩම වම්පසින් පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය .- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම්, මුදලින් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.
(01) ගැනුම් මුදලෙන් 10%ක්ද (සියයට දහයක්),
(02) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද (සියයට එකයි) සහ වැට් බද්ද ද ,
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක් ද (සියයට දෙකහමාරක්),
(04) විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
(05) විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද රු.3000.

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90%ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළතදී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුව අයිතිය ඇත.

අදළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදළ තොරතුරු සඳහා කළමණාකරු- ණය අයකර ගැනීමේ අංශය, පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාළු පාර, කොළඹ 03.
දුරකතන අංක : 0114667218/0112565573.

තුසිත කරුණාරත්න,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු සහ බලයලත්
වෙන්දේසිකරු,

අංක 182/3 (50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකතන අංක : 011-3068185, 2572940.

02-506/2

---

**සෙලාන් බැංකුව පීඑල්සී - අම්පාර ශාඛාව**
1990 අංක 4 දරන බැංකු මගින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අංක 9 වන වගන්තිය යටතේ අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අම්පාර පදිංචි සඳුන් ඉලන්ගමගේ සහ අසංග ඉලන්ගමගේ යන අය බන්ධනදයී වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් එච්.එම්.ශ්‍රියානි ගුණරත්න විසින් සහතික කරන ලද 2012 ක් වූ මැයි මස 30 දිනැති අංක 154 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති දේපළ,

**උපලේඛනය**

නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, පානම පත්තුවේ, පොතුවිල් ගමේ පිහිටි ඉන්ස්පෙක්ටර් ඒදම් නැමති බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස ප්‍රමාණයෙන් රූඩ් 3 යි පර්චස් 28 (අ:0 රූ:3 පර්:28) විශාල ඉඩම. ඉහත සඳහන් ඉඩම නැවත මැනීමකින් පසු පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

නැගෙනහිර පළාතේ, අම්පාර පරිපාලන දිස්ත්‍රික්කයේ, පානම් පත්තුවේ, පොතුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොතුවිල් ප්‍රාදේශීය සභා සීමාව තුළ, පොතුවිල් ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ඒ.පී.මොහමඩ් ටියුබ් විසින් සාදන ලද වර්ෂ 2011.03.10 දිනැති අංක එම්ටී/107/11 සැලැස්මේ නිරූපණය වන ඉනිස්පෙක්ටර් ඒදම් නැමති ඉඩමේ ලොට් 1 ලෙස ලකුණු කල ඉඩම් කොටස ප්‍රමාණය - රූඩ් 3 යි පර්චස් 28 (අ:0 රූ:3 පර්:28) - හෙක්ටයාර් 0.3743 විශාල ඉඩම.
වර්ෂ 2017 ක් වූ පෙබරවාරි මස 27 වැනි දින ප.ව. 2.00 ට දේපළ පිහිටි ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

දේපළට පිවිසීම.- මොනරාගල පාරේ පොතුවිල් නගරයේ T හන්දියෙන් අක්කරපත්තු පාරේ සිට මීටර් 750 ක් පමණ ගොස් දකුණු පසින් වන්නට අක්කරපත්තු ඉනිස්පෙක්ටර් ඒදම් G.T.M. පාසල හමුවේ. එම පාසල ඉදිරිපසින් වම්පසින් වන්නට මෙම දේපළ පිහිටා ඇත. ඉනිස්පෙක්ටර් ඒදම් යනුවෙන් හඳුන්වන මෙම ඉඩමේ කොටසක් පාරට මුහුණලා ඇත.

යෝජනා සම්මුති දැන්වීම.- 2016.03.04 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රයේ ද 2016.03.07 වැනි දිනැති ඩේලිමිලර්, ලංකාදීප සහ 2016.03.08 දිනැති තිනක්කුරල් පුවත්පත් හි පළවී ඇත.

ගෙවීමේ ක්‍රමය .- වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතුය.

(01) ගැනුම් මුදලෙන් 10%ක්ද (සියයට දහයක්)
(02) පළාත් අධිකාරියේ බදු සඳහා 1%
(03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5%ක්
(04) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.
(05) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු.500.
06) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය
(07) ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරියද,

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද, සමග වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න. සහකාර සාමාන්‍යාධිකාරී, නීති සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථනඃ 011-2456485, 011-2456479, 011-2454488.

චන්දිමා ප්‍රියදර්ශනී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු,
උසාවි කොමසාරිස්.

අංක 9 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ,
හෝමාගම.
දුරකථන අංක : 0714318252, 011-2173282

02-545

---

**සෙලාන් බැංකුව පීඑල්සී - බණ්ඩාරවෙල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන)
පනතේ අංක 09 වන වගන්තිය
යටතේ අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

බණ්ඩාරවෙල පදිංචි ලියන ආරච්චිගේ රංග ප්‍රසාද් ලියන ආරච්චි යන අය බන්ධනදායී වශයෙන් ප්‍රසිද්ධ නොතාරිස් රේණුකා උඩුවන විසින් ලියා සහතික කරන ලද 2015 ජූලි මස 02 දිනැති අංක 330 දරන බැඳුම්කරය මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත සුරක්ෂිත කර ඇති පහත උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රය.

වර්ෂ 2017 ක් වූ පෙබරවාරි මස 28 වන දින පෙ. ව. 10. 30 ට දේපළ පිහිටි ස්ථානයේදී සෙලාන් බැංකුව පී එල් සී විසින් මා හට පවරන ලද බලය ප්‍රකාරව මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ.

යෝජනා සම්මුති දැන්වීම : 2016. 12. 09 දිනැති *රජයේ ගැසට් පත්‍රයේ* ද 2016. 11. 28 දිනැති ඩේලිමිලර්, ලංකාදීප සහ 2016.11.18 දිනැති තිනක්කුරල් පුවත්පත් හි පළවී ඇත.

**උපලේඛනය 1**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ , වැදිරට කෝරළේ, බුත්තල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද 2006.01.28 දිනැති අංක 2725 සැලැස්මේ සඳහන් ලොට් 1 ලෙස ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එල් කේ ගුණසේකර විසින් සාදන ලද 1997.03.05 දිනැති අංක 1011 දරන සැලැස්මේ සඳහන් ලොට් 1හි කොටසක නැවත මැනීමක් වන) හුලන්දාවේහේන වරිපනම් අංක 198/2 නමැති සහ හඳුන්වනු ලබන බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් රූඩ් 1 යි පර්චස් තිස් දෙකක් වන ඉඩම සහ එහි පිහිටි සියලු දේද සමග වේ.

**උපලේඛනය 2**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ , වැදිරට කෝරළේ, බුත්තල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද 2003.10.05 දිනැති අංක 2263 සැලැස්මේ සඳහන් ලොට් 1 ලෙස ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එල් කේ ගුණසේකර විසින් සාදන ලද 1997.03.05 දිනැති අංක 1011 දරන සැලැස්මේ සඳහන් ලොට් 1හි කොටසක නැවත මැනීමක් වන) හුලන්දාවේහේන වරිපනම් අංක 198/2 නමැති සහ හඳුන්වනු ලබන බෙදා වෙන්කරන ලද ප්‍රමාණයෙන් පර්චස් තිස්තුනක් වන ඉඩම සහ එහි පිහිටි සියලු දේද සමග වේ.

ඉහත සඳහන් ඉඩම් දෙක බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංගසිංහ විසින් සාදන ලද 2015.06.14 දිනැති අංක එම්ඕ 10551 පිඹුර මගින් එකතු කර ඇති අතර පහත සඳහන් පරිදි විස්තර කර ඇත.

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ , වැදිරට කෝරළේ, බුත්තල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු පී. බී. ඉලංග සිංහ විසින් සාදන ලද 2015.06.14 දිනැති අංක එම්ඕ 10551 සැලැස්මේ සඳහන් ලොට් 1 ලෙස ලකුණු කළ (දෙකම බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද අංක 2725 දරන සැලැස්මේ සඳහන් ලොට් 1 සහ අංක 2263 සැලැස්මේ සඳහන් ලොට් 1 හි එකතු කිරීමක් වන ) හුලන්දවේහේන වරිපනම් අංක 198/2 නමැති සහ හඳුන්වනු ලබන බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් රූඩ් 2 යි පර්චස් 25.9 වන ඉඩම සහ එහි පිහිටි සියලු දේද සමග වේ.

**උපලේඛනය 3**

ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, මොණරාගල කොට්ඨාසයේ , වැදිරට කෝරළේ, බුත්තල ගමේ පිහිටි බලයලත් මිනින්දෝරු ටී. බී. අත්තනායක විසින් සාදන ලද අංක 2263 සැලැස්මේ සඳහන් ලොට් 2 ලෙස ලකුණු කළ (බලයලත් මිනින්දෝරු එල් කේ ගුණසේකර විසින් සාදන ලද 1997.03.05 දිනැති අංක 1011 දරණ සැලැස්මේ සඳහන් ලොට් 1හි කොටසක නැවත මැනීමක් වන) හුලන්දවේහේන නැමැති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටස උඩින් සහ දිගේ මාර්ග අයිතිය සහ නිකුත් හිමිකම් ද සමඟ ප්‍රමාණයෙන් පර්චස් 21.9 වන ඉඩම සහ එහි ප්‍රවේශ මාර්ගය සමඟ වේ.

දේපලට පිවිසීම.- මොනරාගල හන්දියේ සිට (පොතුවිල් පාර හන්දිය) වැල්ලවාය පාරෙන් කිලෝමීටරයක් පමණ පැමිණ මහාධිකරණ පරිශ්‍රය අසලින් දකුණු දෙසට හැරී යනවිට මෙම දේපල පිහිටා ඇත.

ගෙවීම් ක්‍රමය .- වෙන්දේසිය අවසානයේදී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කල යුතුය :-

(1) ගැනුම් මිලෙන් 10%,
(2) පළාත් අධිකාරියේ බදු සඳහා 1%,
(3) වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2.5%,
(4) විකුණුම් කොන්දේසි පත්‍රය සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,
(5) ලිපිකරු සහ සෝෂකගේ ගාස්තු රු. 500,
(6) සම්පූර්ණ ප්‍රචාරණ පිරිවැය,
(7) ගැනුම් මිලෙන් 90% ක් වූ ඉතිරියද.

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු හෝ ගාස්තු වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30 ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවිය යුතුය. ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් නියමිත කාලසීමාව ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපල විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වෙනත් වැඩිදුර විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

සහකාර සාමාන්‍යාධිකාරි - නීති, සෙලාන් බැංකුව පීඑල්සී , අංක 90, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011-2456485 011-2456479

චන්දිමා ප්‍රියදර්ශණී ගමගේ,
බලයලත් වෙන්දේසිකරු, තක්සේරුකරු
උසාවි කොමසාරිස්.

අංක 9 - අයි, හයිලෙවල් පාර,
සර්වෝදය මාවත, පනාගොඩ,
හෝමාගම.
දුරකථන අංක : 0714318252- 011- 2173282.

02-544

---

**කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී මගින් - (පස්සර ශාඛාව)**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලොන් පී. එල්. සී (ලියාපදිංචි අංක පී කිව්116) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ මොණරාගල ග්‍රාම නිළධාරි වසමේ බුත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ බුත්තල වැදිරට කෝරලේ මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුප්පනේ ග්‍රාමයේ හි පිහිටි හෙළහේන්වල වත්ත නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. ඉලන්ගසිංහ විසින් 2006 ජුනි 04 වන දින මැන සාදන ලද අංක 1334 දරණ පිඹුරේ සඳහන් ලොට් 1 දරන ප්‍රමාණය රූඩ් එකයි පර්චස් තිස්හතයි දශම අට (අ. 0 රූ. 1 පර්. 37.8) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි සියළු දේත් සමඟ වේ.

හේරත් මුදියන්සේලාගේ නිහාල් හේරත් ණයකරු වශයෙන් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ වර්ෂ 2017 ක්වූ මාර්තු මස 10 වැනි දින ප. ව. 1.00 ට ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වන දින රජයේ ගැසට් පත්‍රයද 2016.12.20 වන දින ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් බලන්න. විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.02.09 වන දින රජයේ ගැසට් පත්‍රය ද 2017.02.09 ලක්බිම, ද අයිලන්ඩ් සහ වීරකේසරී පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම.- මොණරාගල නගර මධ්‍යයේ සිට පොතුවිල් පාරේ මීටර් 75 ක් පමණ ගමන් කර පාරේ දකුණු පස පිහිටි පොළ පාරට හැරී තවත් මීටර් 250ක් පමණ ගමන් කළ පසු අදාළ දේපළ පාරේ වම්පස පිහිටා ඇත.

ගෙවීමේ ක්‍රමය.- විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීමේ වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%) (03) වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%) (04) නොතාරිස් ගාස්තුව රු. 2,000/- (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 500/- (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියළුම ප්‍රචාරක වියදම් (07) ගැණුම්කරු විසින් එකතු කල වටිනාකම් බද්ද (VAT) ගෙවිය යුතුයි. (08) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනුව (90%) විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී හි ප්‍රධාන කාර්යාලයේ හෝ පස්සර ශාඛාවේ තැන්පත් කළ යුතුය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අය ගෙන් විමසන්න.

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල, උසාවි පාර, කොළඹ 12.
දුරකථන/ ෆැක්ස් : 011-2445393
ඊමේල් senaservice@sltnet.lk

කළමණාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී.,
අංක 278/280,
මහා වීදිය, පස්සර.
දුරකථන අංකය : 055- 2288007
ෆැක්ස් අංකය : 055- 2288008

02-442

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී**

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව වෙන්දේසිය පිළිබඳ දැන්වීමයි

**පළමුවන උපලේඛනය**

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ, අඹතලෙන් පහළ අළුත් කුරු කෝරළේ කොටිකාවත්ත සහ මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 4 දරන නාගරික කොට්ඨාසයේ අංක 503 ඒ දරන කොන්ගම ග්‍රාම නිලධාරි වසමේ කැළණිමුල්ලේ පිහිටි කොළඹ පාරේ වරිපනම් අංක 703 සහ 703/1/1 දරන හික්ගහවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ විසින් මැන සාදන ලද අංක 12134 සහ 2012.05.15 දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක 1 ප්‍රමාණය පර්චස් දහයයි දශම දෙකයි බිංදුවක් (අ. 0 රූ. 0 පර්. 10.20) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පලතුරු, ආදී සෑම සියලු දේත් සමගය.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 05/76 දරන වෙළුමේ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත

**දෙවන උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ පල්ලේ පත්තුවේ කඩුවෙල මහ නගර සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 11 දරන නාගරික කොට්ඨාසයේ අංක 470 දරන පහළ බෝමිරිය ග්‍රාම නිලධාරී වසමේ පහළ බෝමිරිය ගමේ පිහිටි අවිස්සාවේල්ල පාරේ වරිපනම් අංක 548/20 දරන දීගලවත්ත *හෙවත්* ගලබොඩවත්ත (ගලහේන වත්තේ කොටසක්) නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. එස්. කේ. සමරවීර විසින් මැන සාදන ලද අංක 8204 සහ 2013.06.28 දින දරණ පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද කැබලි අංක 22/1 දරන බිම් කොටස.

ප්‍රමාණය රූඩ් එකයි පර්චස් හයක් (අ. 0 රූ. 1 පර්. 06) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගොඩනැගිලි ගහකොළ, පළතුරු, ආදී සෑම සියලු දේත් සමගය.

මෙම ඉඩම හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 657/33 දරන වෙළුමේ පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත. (බලයලත් මිනින්දෝරු වී. ඒ. එල්. සේනාරත්න විසින් මැන සාදන ලද අංක 363 දරන සහ 1952.07.27 දින දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 22 හි නැවත මැනීමකි)

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් නිරෝධා සුලේක්ෂලී කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1455 සහ 2014.01.28 දින සහ එම නොතාරිස් විසින් ම සහතික කරන ලද අංක 1456 සහ 2014.01.28 දින දරන උකස් බැඳුම්කරය ප්‍රකාරව ඉහත පළමු සහ දෙවන උපලේඛනයෙ හි සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම් දේපළ සහ පරිශ්‍රය බන්ධනාදායී වශයෙන්, ප්‍රේම්නාත් චමින්ද දොළවත්ත යන අය බන්ධනදායී වශයෙන් කොළඹ 02 යූනියන් පෙදෙසේ අංක 242හි පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී නමට උකස් කොට ඇපයට තබා ඇති උකස් බැඳුම්කරය මගින් සුරක්ෂිත කරන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම එකී බන්ධනදායී විසින් පැහැර ඇති හෙයින්,

නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. විසින් අප හට පවරා ඇති බලය ප්‍රකාරව, ඉහත පළමු වන උපලේඛනයේ සඳහන් දේපළ 2017 ක්වූ මාර්තු මස 03 වැනි දින ප. ව. 2.00 ට සහ ඉහත දෙවන උපලේඛනයේ සඳහන් දේපළ 2017 ක්වූ මාර්තු මස 03 වැනි දින ප. ව. 12.00 ට අදාළ දේපළ පිහිටි ස්ථානයේදී අප විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ

දේපළට පිවිසීම.-

පළමුවන උපලේඛනය.- කොළඹ- අවිස්සාවේල්ල බී1 මාර්ගයේ (ලෝ ලෙවල් මාර්ගය) කි. මී 5ක් පමණ ගමන් කළ විට අංගොඩ හන්දිය පසු වී මීටර් 50ක් පමණ ගමන් කළ විට අදාළ වරිපනම් අංක 703 දරන දේපළ දකුණු පසින් පිහිටා ඇත.

දෙවන උපලේඛනය.- කොළඹ- අවිස්සාවේල්ල බී1 මාර්ගයේ (ලෝ ලෙවල් මාර්ගය) කි. මී 2ක් පමණ ගමන් කළ විට කඩුවෙල හන්දිය හමුවේ එතැනින් දකුණට හැරී මීටර් 6 ක් පමණ පළල පුද්ගලික පාරේ මීටර් 60ක් පමණ ගමන් කළ විට අදාළ දේපළ පිහිටා ඇත.

ගෙවීම් කළ යුතු ආකාරය.- විකිණීම ස්ථිර කළ විගස පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත අත්පිට මුදලින් ගෙවිය යුතුය.

01 ගැණුම් මිලෙන් සියයට දහයක් 10%,
02 ඉතිරි සියයට අනුව (90%) ගෙවීම් ස්ථිර කළ දින සිට දින 30 ක් ඇතුළත නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. හි ප්‍රධාන කාර්යාලයේ තැන්පත් කළ යුතුය,
03 වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%),
04 පළාත් පාලන අය බදු සියයට එකයි (1%),
05 ප්‍රචාරක වියදම් සහ අනෙකුත් වියදම් 100%,
06 ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,000,
07 නොතාරිස් ගාස්තුව සහ අනෙකුත් වියදම් රු. 2,000.

හිමිකම් ඔප්පු පරීක්ෂාව සඳහා පහත සඳහන් නිලධාරින්ගෙන් විමසන්න - නීති දෙපාර්තමේන්තුව, නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී. එල්. සී. අංක 242, යූනියන් පෙදෙස, කොළඹ 02. දුරකථන අංකය : 0114218743.

ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස්,
බලයලත් වෙන්දේසිකරුවෝ තක්සේරුකරුවෝ
සහ උසාවි කොමසාරිස්වරු - කොළඹ වාණිජ
මහාධිකරණ සහ දිසා අධිකරණය බලයලත්
වෙන්දේසිකරුවෝ රාජ්‍ය සහ වාණිජ බැංකු.

අංක 200, හල්ස්ඩෝෆ් වීදිය,
කොළඹ 12.
දුරකථන අංකය : 077-3181891

02-445

---

**I කොටස : I ඡෙදය යටතේ පළවන දැන්වීම්**
**2017.02.09 වැනි දින ගැසට් පත්‍රයේ පළවේ.**

මුද්‍රණය හා බෙදාහැරීම ලංකාවේ සීමාසහිත එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගම විසිනි.
www.documents.gov.lk